# බේරුවල නගර සභාව

## 2022.02.08 දින පැවති බේරුවල නගර සභාවේ මාසික මහා සභා රැස්වීමේ සංක්ෂිප්ත වාතර්ාව

ආගම සිහි කිරීමෙන් අනතුරුව ගරු සභාපති අල්හාජ් ඇම්.මසාහිම් මොහොමඩ් මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව.10.00 ට සභා රැස්වීම ආරම්භ විය.

**සහභාගිත්වය**

| | | | |
|---|---|---|---|
| 1. | ගරු සභාපති | - | අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා |
| 2. | ගරු උප සභාපති | - | එම්.ආර්.එම්.මුනව්වර් මහතා |
| 3. | ගරු මන්ත්‍රී | - | එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා |
| 4. | ගරු මන්ත්‍රී | - | එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා |
| 5. | ගරු මන්ත්‍රී | - | අහමඩ් දිල්සාත් මහතා |
| 6. | ගරු මන්ත්‍රිනී | - | එම්.ජේ.එච්.ඒ.පද්මකාන්ති මිය |
| 7. | ගරු මන්ත්‍රිනී | - | කේ.උදේනි අමල්කා ප්‍රනාන්දු මිය |
| 8. | ගරු මන්ත්‍රී | - | එම්.එෆ්.එම්.හසන් මහතා |
| 9. | ගරු මන්ත්‍රී | - | අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා |
| 10. | ගරු මන්ත්‍රී | - | එම්.ජේ.එම්.එච්.මොහමඩ් නස්මී මහතා |
| 11. | ගරු මන්ත්‍රී | - | එම්.එම්.එම්.සියාන් මහතා |
| 12. | ගරු මන්ත්‍රිනී | - | එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය |
| 13. | ගරු මන්ත්‍රී | - | අල්හාජ් එම්.ඒ.එම්.අරුස් මහතා |
| 14. | ගරු මන්ත්‍රිනී | - | එම්.එච්.ෆාතිමා රිනූසා මිය |

**නොපැමිණි සභිකයින්**

| | | | |
|---|---|---|---|
| 1 | ගරු මන්ත්‍රී | - | අල්හාජ් එම්.එන්.ෆවුසුල් අමීර් මහතා |
| 2. | ගරු මන්ත්‍රී ` | - | එම්.එස්.මොහමඩ් මුස්ෆිර් මහතා |

**සහභාගී වූ නිලධාරීන්**

| | | | |
|---|---|---|---|
| 1. | ලේකම් | - | අශෝක රණසිංහ මහතා |
| 2. | වැඩ අධිකාරි | - | ජේ.කේ.සී.ජයනෙත්ති මහතා |
| 3. | ආදායම් පරීක්ෂක | - | පී.ඩී.පී.එස්.අබේගුණවධර්න මහතා |
| 4. | සංවධර්න නිලධාරි (සභා කටයුතු) | - | වත්සලා කුමාරි තම්මිට |

**අ.**

**1.2022.01.11 දින පැවැති මාසික මහ සභා රැස්වීම් වාතර්ාව සභා සම්මත කිරීම.**

2022.01.11 වන දින පැවති මාසික සභා රැස්වීම් වාතර්ාව සත්‍ය වාතර්ාවක් බවට ගරු මන්ත්‍රී එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී අහමඩ් දිල්සාත් මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ආ. සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදන.**

**ඇ. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා.**

ඇ.1 ගරු මන්ත්‍රී අල්හාජ් එම්.එන්.ෆවුසුල් අමීර් මහතා අසනිප තත්ත්වයෙන් පසුවන බැවින් මෙම මස මාසික මහ සභා වාරය සඳහා පැමිණීමට නොහැකි බව දුරකතන පණිවිඩයක් මගින් දැනුම් දී ඇත.එබැවින් එදිනට නිවාඩු අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අහමඩ් දිල්සාත් මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

ඇ.2 ගරු මන්ත්‍රී එම්.එස්.මොහමඩ් මුස්ෆිර් මහතා මෙම මස මාසික මහ සභා වාරය සඳහා පැමිණීමට නොහැකි බව දැනුම් දී ඇත.එබැවින් එදිනට නිවාඩු අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.එම්.සියාන් මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**ඇ. සංදේශ, පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරීම.**

ඇ.1. ගරු මන්ත්‍රී එම්.එම්.එම් සියාන් මහතා විසින් බේරුවල පොදු වෙළඳ පොළ කඩ කාමරයක ව්‍යාපාර නාමය වෙනස් කිරීම ,වාරික ක්‍රමය යටතේ ණය මුදල් ගෙවීම සහ කඩ කාමරයේ අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම සම්බන්ධයෙන් සභාගත කිරීම.**(ඇමුණුම 01)**

**ගරු සභාවේ දැන ගැනීම සඳහා මෙම ලිපිය සභාගත කරන ලදි.**

ඇ.2 නො 30,බණ්ඩාරවත්ත,බේරුවල ලිපිනයෙහි පදිංචි කේ.එස් පී මධුක ගිහාන් යන අය විසින් 2022.02.07 දින සහිතව බේරුවල පොදු වෙළඳ පොළ කඩ කාමර නම් හැරවීම සඳහා සහන කාලයක් හා මුදල පහත පරිදි කොටස් තුනක් හා කඩ කාමර දොරවල් හා අඩුපාඩු සකස් කර දෙන මෙන් ඉල්ලීම් කර ඇති ලිපිය සභාගත කිරීම. **(ඇමුණුම 02)**

**ගරු සභාවේ දැන ගැනීම සඳහා මෙම ලිපිය සභාගත කරන ලදි.**

ඇ.3 බේරුවල සුහද සේවා හවුලේ, ලේකම් විසින් 2022.02.06 දිනැති ලිපිය මගින් බේරුවල එෆ්.අයි ප්‍රනාන්දු ගොඩනැගිලි පරිශ්‍රයේ පිහිටි අනවසර වෙළඳසැළ ඉවත් කිරීම ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කිරීම. **(ඇමුණුම 03)**

**ගරු සභාවේ දැන ගැනීම සඳහා මෙම ලිපිය සභාගත කරන ලදි.**

ඇ.4 නො 91,මරදාන,බේරුවල,මරදාන වැරටි සංවිධානය විසින් 2022.02.07 දිනැති ලිපිය මගින් ප්‍රජා ශාලාවක් සඳහා ස්ථානයක් ලබා ගැනීම සම්බන්යෙන් ඉදිරිපත් ලිපිය සභා ගත කිරීම. **(ඇමුණුම 04)**

**ගරු සභාවේ දැන ගැනීම සඳහා මෙම ලිපිය සභාගත කරන ලදි.**

**ඉ. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**
නැත.

**ඊ. යථා පරිදි කල්දී ඇති යෝජනා**

**ඊ.1 ගරු සභාපති අල්හාජ් එම්. මසාහිම් මොහොමඩ් මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ඊ1.1** පළාත් පාලන අයතන වල නගරාධිපතිවරුන් හා සභාපතිවරුන් සඳහා පිහිටුවා ඇති පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ 2022 වෂර්ය සඳහා සාමාජික මුදල් වශයෙන් රු 25,000.00 මුදලක් එම ආයතනය වෙත ගෙවීමට ගරු සභාවට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**ඊ1.2** ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිගේ අංක ප්‍රා.සේ.ම/බ.ද/මා.ස/04/II-V හා 2022.01.10 දිනැති ඉල්ලීම් ලිපිය පරිදි නගර සභාවන්හි සැළසුම් අනුමත කිරීමේ කමිටුවට ජල සම්පාදන මණ්ඩලයේ නියෝජිතයෙකු පත් කිරීම සඳහා ගරු සභාවට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා ස්ථිර කරන ලදි.මෙම යෝජනාව සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයක් නොලැබීම මත මෙම යෝජනාව සභා සම්මත නොවන ලදි.**

**ඊ.1.3** ඵලදායිතා වැඩසටහන 2022 සඳහා 2022 .02.10 වන දින ආයතනගත කායර්ය මණ්ඩලය සඳහා ආකල්ප සංවධර්නය කිරීමේ වැඩසටහනක් පැවැත්වීම සඳහා රු 6000.00 මුදලක් සභා අරමුදලින් වියදම් දැරීමට ගරු සභාවට යෝජනා කරමි. (දළ වියදම් ඇස්තමේන්තුව ඇමුණුම 05)

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**ඊ1.4** පරණ කඩේ බෝගහ අසල මාගර්ය ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරීම ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුදල වන රු1,95000.00 ක මුදලට අදාල ඇස්තමේන්තුව අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**ඊ1.5** රවුෆ් මාවත නො 60/03 කඩය ඉදිරිපිට බෝක්කුව තැනිම ව්‍යාපෘතියේ සංශෝධිත ඇස්තමේන්තු මුදල වන රු 2,67500.00 ක මුදල අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**ඊ1.6** බේරුවල නගර සභාවේ පොදු වෙළඳ පොළ ඉහල මහල අංක 16,17 කඩ කාමර 02 සඳහා කඩ බදු කරුවන්ගේ ඉල්ලීම මත 2021.10.25 වන දින කළුතර ප්‍රධාන තක්සේරුකරු වෙත යවන ලද ලිපියට අනුව පොදු වෙළඳ පොළ ඉහළ මහල කඩ කාමර අංක 15.16,17 කඩ කාමර සඳහා මාසික කඩ කුලිය 2022 ජනවාරි මස සිට කළුතර නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු විසින් පහත සඳහන් ආකාරයට සංශෝධනය කර ඇත. ඒ අනුව එම සංශෝධිත තක්සේරු වටිනාකම පිළිගැනීමටත්, එම මුදල අනුමත කිරීමටත් ගරු සභාවට යෝජනා කරමි.

| උඩු මහල කඩ කාමර | සංශෝධිත තක්සේරු වටිනාකම |
|---|---|
| 15 | රු4,750.00 |
| 16 | රු4,750.00 |
| 17 | රු4,750.00 |

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**ඊ1.7** 2021.12.14 වන දින මහ සභාවේ ඊ 1.25 යෝජනා සම්මුතිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද පහත ගෙවීම් සභා අනුමැතියට ගරු සභාවට යෝජනා කරමි.

**ආවරණ අනුමැතියට යටත්ව කරන ලද ගෙවීම්**

| දිනය | නම | විස්තරය | වවුචර් අංකය | මුදල (රු.ශත) |
|---|---|---|---|---|
| 01.2 | එන්.කේ.එස් .යූ සිල්වා | 2022 වෂර්ය සඳහා සභාව සතු වාහන වෙත ඉන්ධන සැපයිම වෙනුවෙන් ආරක්ෂිත ඇප මුදල් තැම්පත් | 01 | 150000.00 |
| 1.2 | මුදල් භාරකරු | 2022 වෂර්ය සඳහා සුළු මුදල් අත්තිකාරම් ලබා ගැනීම | 02 | 15000.00 |
| 1.3 | මුදල් භාරකරු | 2022 වෂර්ය වෙනුවෙන් කායර්ාලයේ නිලධාරි මහත්ම මහත්මීන් හා සේවක මහත්ම මහත්මීන් (94)වෙනුවෙන් විශේෂ අත්තිකාරම් ගෙවිම. | 01 | 376000.00 |
| 1.5 | ධනිදු කන්ස්ට්‍රක්ෂන් | දගර්ා පාර කාණුව ඉදිකිරීම අවසන් ගෙවිම | 04 | 152856.18 |
| 1.5 | ධනිදු කන්ස්ට්‍රක්ෂන් | සාවියා පාර අතුරු මාගර්ය තාර දැමීම අවසන් ගෙවිම | 06 | 1,58592.33 |
| 1.5 | ධනිදු කන්ස්ට්‍රක්ෂන් | හනපි මාවත නයිම් මයාගේ නිවස අසල කැඩී ඇති කාණු කොටස ප්‍රතිසංස්කරණය කිරීම | 07 | 56340.09 |

| | | | | |
|---|---|---|---|---|
| 1.5 | මුදල් භාරකරු | කෙරවල පිටියට කසල ගෙන යාම සඳහා අධිවේගී මාගර්යේ ප්‍රවාහන ගාස්තු වෙනුවෙන් ලබාගත් අත්තිකාරම් පියවීම.<br>2022.01.14 – ZA -9261-500.00X2<br>- LL – 6978-500.00X2<br>2022.01.15- LL – 6978-500.00<br>2022.01.15 - ZA -9261-500.00<br>2022.01.18 - ZA -9261-500.00 X2<br>2022.01.20 - ZA -9261-500.00 X2<br>2022.01.21- ZA -9261-500.00X2<br>2022.01.22- ZA -9261-500.00 X 2<br>2022.01.23 - - ZA -9261-500.00 X 2<br>2022.01.24- LL – 6978-500.00 X 2<br>2022.01.24- ZA -9261-500.00 X 2 | 10 | 10000.00 |
| 1.5 | සුදශරී කන්ස්ට්‍රක්ෂන් | නල්ලහේන හරස් පාර අතුරු මාගර්ය සඳහා කාණුව ඉදි කිරීම 10% අතරුදවුම් හා කායර් සාධන සුරක්ෂණය | 09 | 60276.32 |
| 1.5 | සුදශරී කන්ස්ට්‍රක්ෂන් | සිරි සුමේධ මාවත මුස්හීර් මන්ත්‍රිතුමාගේ නිවස ඉදිරිපිට කාණුව ඉදිකිරීම. | 08 | 38950.91 |
| 01.7 | එම්.එන්.එම් නිලාෆීර් | 2021.11.08 සිට 202115.15 දක්වා හිඟ වරිපනම් එකතු කිරීම වෙනුවෙන් 12% කොමිස් මුදල ගෙවිම | 16 | 61496.44 |
| 1.6 | අනුෂ්ක ජීවකුමාර | අතිකාල දීමනා ගෙවීම | 15 | 17558.00 |
| 1.7 | මුදල් භාරකරු | 2022 ජනවාරි මස වැටුප් අත්තිකාරම් ගෙවීම | 19 | 39500.00 |
| 1.10 | මුදල් භාරකරු | 2022 වෂර්ය සඳහා සුළු මුදල් අත්තිකාරම් ලබා ගැනීම | 31 | 15000.00 |
| 1.11 | උපාලි දොරේගම ඇසෝසේෂන් (පුද්) සමාගම | 2021 වෂර්ය සඳහා වාහන තක්සේරුවට ගෙවීම් කිරීම. | 32 | 62,500.00 |
| 1.11 | අයි.බී.ඩී.සඳමාලි | 50- 6101 කැබ් රථය අලුත්වැඩියා කිරීම | 33 | 35,400.00 |
| 1.11 | එන්.එච්.පියසේන සහ පුත්‍රයෝ (පුද්) සමාගම | 50- 6101 කැබ් රථය අලුත්වැඩියා කිරීම සඳහා වාහන අමතර කොටස් මිළදී ගැනීම | 34 | 51300.00 |
| 1.11 | ඩී ඇන්ඩ් ඩී මෝටසර් ඇන්ඩ් සවර්ස් ස් | PE – 6864 කැබ් රථය සම්පූණර් සේවා කිරීම | 35 | 28,417.00 |
| 1.11 | කාන්ති පොත්හල | බේරුවල මහජන පුස්කාලයට නොවැම්බර් මාසයට ලබා ගත් පුවත්පත් සඳහා ගෙවීම | 37 | 28110.00 |
| 1.11 | රේන්බෝ ස්ටේෂනරි ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල් | කායර්ාලයට අවශ්‍ය පරිගනක කොළ ලබා ගැනිම වෙනුවෙන්<br>5 ½ x 11පැකට් 7x900.00 = 6300.00<br>9 ½ x 2 ply 5x3500.00 = 17500.00 | 39 | 23800.00 |

| | | | | |
|---|---|---|---|---|
| | | = 23800.00 | | |
| 1.11 | මුදල් භාරකරු | 2022.01.12 ඩෙංගු මධර්න වැඩසටහන සඳහා සංග්‍රහ කටයුතු වෙනුවෙන් | 44 | 15000.00 |
| 1.13 | සුදශරී කන්ස්ට්‍රක්ෂන් | රේගුව පාර කොන්ක්‍රීට් දැමීම (96 බී නිවස සිට 90/4 නිවස දක්වා අවසන් ගෙවීම) | 45 | 215,443.26 |
| 1.13 | සුදශරී කන්ස්ට්‍රක්ෂන් | චීනකොටුව පල්ලිය ඉදිරිපිට කාණුව ඉදි කිරීම අවසාන ගෙවීම | 46 | 405,301.45 |
| 1.13 | අරුණි මංගලිකා ද සිල්වා | පහත දිනයන්හි කෙළවරපිටියට කසළ ගෙන යාම සඳහා ලබා ගත් අත්තිකාරම් පියවීම .<br>2022.01.06 – 1000.00<br>2022.01.07 – 2100.00<br>2022.01.08 – 2000.00<br>2022.01.09 – 3100.00<br>2022.01.10 – 2000.00 | 49 | 10,200.00 |
| 1.13 | මුදල් භාරකරු | සුළු අක්මුදල් අග්‍රිමය අලුත් කිරීම | 50 | 14,892.00 |
| 1.13 | එන්.කේ.එස් .යූ සිල්වා | සභාව සතු වාහන සඳහා ඉන්ධන ලබා ගනීම වෙනුවෙන් ගෙවීම් කරීම | 51 | 127221.30 |
| 1.13 | ඉන්ෆොටෙක් ඔෆිස් ඔටෝමේෂන් | 107AHP ටෝනර් - 05 x 17300.00 = රු. 86500.00<br>AR020ST ටෝනර් - 02 x 15500.00 = රු. 31000.00<br><br>324 කැනොන් - 2 x 36500.00 = රු.733000.00<br>එකතුව = රු.190500.00 | 52 | 190,500.00 |
| 1.13 | එම්.ඩී.ඒ.කේ. ගුණරත්න | 2021.12.16 – 2021.12.27 කසල වත්තේ කසල තුනී කිරීම සඳහා චේන් ලෝඩරය යොදා ගැනීම වෙනුවෙන්<br><br>මීටර් පැය 54.6 x 2200 = 120120.00 | 53 | 120120.00 |
| 1.18 | එම්.එම්.එම්.නාලිම් | බේරුවල මධ්‍යම යාන්ත්‍රික වැඩපොළෙහි එක්රැස්ව තිබූ ෆයිබර් කොටස් ඉවත් කිරීම.<br>50 x 6500.00 = රු.325000.00 | 59 | 325000.00 |
| 1.18 | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ් | කායර්ාලයීය දුරකථන බිල්පත් ගෙවීම - 2021 දෙසැම්බර්<br>සභාපතිතුමා - 2328.21<br>ෆැක්ස් යන්ත්‍රය - 1164.72<br>පිලිගැනීමේ නිලධාරී - 3082.26<br>ලේකම් - 6945.73<br>කමර්ාන්ත අංශය - 1077.88<br>නැණසල - 2523.53 | 60 | 19,618.81 |

| | | | | |
|---|---|---|---|---|
| | | උපසභාපතිතුමා - 611.79<br>රවුටරය - 980.81<br>වරිපනම් අංශය - 903.88 | | |
| 1.18 | ඇවනස්මාටර් ඉංජිනියරින් සමාගම | ZA 5086 බැකෝ යන්ත්‍රයේ අළුත්වැඩියාව | 57 | 82791.30 |
| 1.18 | සුදශරී කන්ස්ට්‍රක්ෂන් | ෂේක් මසූතාපා පල්ලිය පාර ඉතිරි කොටස සඳහා බට යෙදිම අවසන් ගෙවීම | 58 | 993745.03 |
| 1.19 | එන්.ඒ.ඩී රංජිත් | 49-4716<br>RD-2781 ට්‍රැක්ටර් රථයේ මීටර් සවි කිරීම | 66 | 25000.00 |
| 1.19 | එම්.එස්.පී.ශමරීලා | මාසික සභා වාතර්ාව දෙමළ භාෂාවට පරිවතර්නය කිරීම සඳහා භාෂා පරිවතර්න ගාස්තු | 67 | 42,662.50 |
| 1.19 | රෙජිස්ටාර් ජෙනරාල් | 2020 වෂර්යට අදාළව ඉඩම් රෙජිස්ටාර් කායර්ාලය මුද්දර ගාස්තු උපලේඛන වලට අදාළව ගෙවීම | 69 | 21,600.00 |
| 1.20 | කළුතර දිස්ත්‍රික් සමූපකාර ග්‍රාමීය බැංකු සංගමය | කායර්ාලය සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් | 74 | 49,135.00 |
| 1.20 | මුදල් භාරකරු මහින් පී.කේ.ඩී.ආර්.ප්‍රියලාල් | විදුලි ජනන යන්ත්‍රයට අවශ්‍ය සුපිරි ඩීසල් ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලබා ගැනීම | 76 | 15,900.00 |
| 1.20 | මුදල් භාරකරු මහින් පී.කේ.ඩී.ආර්.ප්‍රියලාල් | කමර්ාන්ත අංශයට අවශ්‍ය පිරිසිදු කිරීම් සඳහා කැති ලබා ගැනීමට අත්තිකාරම් ලබා ගැනීම | 79 | 12,500.00 |
| 1.21 | ඇම්.බී.කල්පගේ පුෂ්ප කුමාර | RB – 2266 ට්‍රැක්ටරයේ මෝටරයේ අලුත්වැඩියාව | 81 | 17,854.00 |
| 1.24 | එන්.කේ.එස්.යූ ද සිල්වා | සභාව සතු වාහන සඳහා ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 86 | 51,107.00 |
| 1.24 | එන්.කේ.එස්.යූ ද සිල්වා | සභාව සතු වාහන සඳහා ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 87 | 100,589.86 |
| 1.24 | සුදශරී කන්ස්ට්‍රක්ෂන් | පල්ලිය පාර ප්‍රධාන බෝක්කුව ඉදි කිරීම(ගාලු පාරට ආසන්නව ඇති ) අවසන් ගෙවීම | 88 | 689164.92 |
| 1.24 | ඇම්.බී.කල්පගේ පුෂ්ප කුමාර | RD – 2781 ට්‍රැක්ටරයේ ඔයිල් කාන්දු වීම ඇතුළු අලුත්වැඩියාවන් හා බ්‍රේක් පද්ධතිය අලුත්වැඩියාවන් සඳහා. | 89 | 87,625.00 |
| 1.25 | ජේ.කේ.සී.ජයනෙත්ති | ජනවාරි මස දීමනා ගෙවීම | 98 | 62,950.00 |
| 1.25 | සුදශරී කන්ස්ට්‍රක්ෂන් | මරදාන ලෙල්ලමෙහි කාණු පද්ධතිය ඉදි කිරීම - දෙවන අදියර | 99 | 628,315.54 |
| 1.26 | මුදල් භාරකරු | 2022.01.27 දින පැවැත්වීමට නියමිත වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම හා සහභාගිවූවන් සඳහා සංග්‍රහ වියදම් | 103 | 24,000.00 |
| 1.27 | ඉන්ෆොටෙක් ඔෆීස් ඔටෝමේෂන් | ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම<br>Digital Multifunctional Heavy Duty Photocopy | 104 | 710,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 1.27 | ඇම්.බී.කල්පගේ පුෂ්ප කුමාර | RV – 1299 ටේලරය දිරාගිය තට්ටුව අලුත්වැඩියා කිරීම | 106 | 24,856.56 |
| 1.27 | කන්දූරි රෙස්ටුරන්ට් | වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනට සහභාගි වූ පිරිසට දිවා ආහාරය සැපයීම<br>100 x 480.00 = රු.48,000.00 | 108 | 48,000.00 |
| **සේවක ණය** | | | | |
| 1.05 | එන්.එන්.එස්.එස් ඩයස් මිය | ආපදා ණය ගෙවීම -පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී- එන්.එන්.එස්.එස් ඩයස් මිය | 06 | 250000.00 |
| 1.10 | ඊ.එල් සමීර සඳරුවන් මයා | ආපදා ණය ගෙවීම - යන්ත්‍ර ක්‍රියාකරු - ඊ.එල් සමීර සඳරුවන් මයා | 07 | 108180.00 |
| 1.20 | එම්.එන්.එම් සම්සුදීන් මයා | ආපදා ණය ගෙවීම -මුරකරු-එම්.එන්.එම් සම්සුදීන් මයා | 08 | 84200.00 |
| 1.20 | එම්.එම්.එෆ් ඉෆ්ෆත් මිය | ආපදා ණය ගෙවීම - සෞඛ්‍ය කම්කරු - එම්.එම්.එෆ් ඉෆ්ෆත් මිය | 10 | 65400.00 |
| 1.20 | කේ පාවර්තී | ආපදා ණය ගෙවීම - සෞඛ්‍ය කම්කරු - කේ පාවර්තී මිය | 11 | 116690.00 |

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

**ඊ1.8** 2021.12.31 දිනෙන් අවසන් වන වෂර්ය සඳහා ගබඩා භාණ්ඩ සමීක්ෂණ වාතර්ාව අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි. (ඇමුණුම 06)

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

**ඊ1.9** 2021.12.31 දිනෙන් අවසන් වන වෂර්ය සඳහා කායර්ාල භාණ්ඩ සමීක්ෂණ වාතර්ාව අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි. (ඇමුණුම 07)

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

**ඊ1.10** 2021.12.31 දිනෙන් අවසන් වන වෂර්ය සඳහා පුස්තකාල පොත් සමීක්ෂණ වාතර්ාව අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි. (ඇමුණුම 08)

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

**ඊ1.11** 2021.12.31 දිනෙන් අවසන් වන වෂර්ය සඳහා වාහන සමීක්ෂණ වාතර්ාව අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි. (ඇමුණුම 09)

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

**ඊ1.12** පළාත් සංවධර්න ප්‍රදාන - 2022 යටතේ බේරුවල නගර සභාවට අයත් ආයුවේර්ද ගොඩනැගිල්ල ඉදිකිරීම ii වන අදියර සඳහා අනුමත වී ඇති රු 6,000,000.00 ක මුදලින් එම ව්‍යාපාතිය ක්‍රියාත්මක කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

උ. **කාරක සභා වාතර්ා පිළිබඳ සමාලෝචනය**

**ඌ. සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය කිරීම.**

**ඌ.1.** 2022 ජනවාරි මාසික වියදම් සාරාංශය **(ඇමුණුම 10 )**

**ඌ .2.** 2022 ජනවාරි මාසික ආදායම් සාරාංශය **(ඇමුණුම 11 )**

**එ. තව දුරටත් සභාව තීරණය කරන ලදුව න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති කරුණු** (වෙනත් කරුණු)

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
සියාන් මන්ත්‍රිතුමා මගින් මධුක ගිහාන් යන අය ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා.වාරික ක්‍රමය යටතේ හිඟ මුදල් ගෙවන්න ඉල්ලීමක් කරලා.එයාට කියන්න මාව ඇවිත් මුණගැහෙන්න කියලා.අපි නීතිමය විදිහට එයාට දැනුම් දීලා තියෙනවා.ඒක තමයි නීතිය. එහෙම කරන්න බැහැනේද ලේකම්තුමා.

**ගරු මන්ත්‍රී - අහමඩ් දිල්සාත් මහතා**
ඒක නීතියට අනුව කරන්න.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
බේරුවල එෆ් අයි ප්‍රනාන්දු ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරලා තියෙන ලිපියේ සඳහන් කරලා තියනවා එෆ් අයි ප්‍රනාන්දු ගොඩනැගිලි පරිශ්‍රයේ ඇති වෙළඳ සැල මම එතනින් ඉවත් කර සුදුසු ස්ථානයක් දෙනවා කියලා මම ප්‍රකාශ කළා කියලා මේ ලිපියේ සඳහන් කරලා තියෙනවා. මම එහෙම ප්‍රකාශයක් කරලා නැහැ. මේක අරන් ආපු එක්කෙනාට කිව්වා. මම සභාවට එන්න කලින් ඉදලම එතන කඩ දාගෙන ඉන්නවා. ඒ කඩේ නිත්‍යානුකූලව ලයිට් අරගෙන ඔක්කොම අවසර අරගෙන කරන එකක්. මේගොල්ලෝ තාම නීත්‍යානුකූව අරගෙන නැහැනේ එෆ්.අයි.ගොඩනැගිල්ල.

**ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය**
මට කිව්වේ නගරාධිපතිතුමා, ඔබතුමා එදා එතනට ගිහිල්ලා එහෙම ප්‍රකාශයක් කරලා තියෙනවා කියලා එයාට වෙනම ස්ථානයක කඩයක් දෙනවා කියලා. ඒ කඩහිමියව එතනින් අයින් කරලා වෙන තැනක් දුන්නාම ඒ ප්‍රශ්නෙ විසඳෙනවනේ ගරු නගරාධිපතිතුමා.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
මෙතන ප්‍රශ්නයක් නැහැ. මෙතන ප්‍රශ්නෙ තියෙන්නේ සුහඳ සේවා හවුල තමයි .ඒ අය නීත්‍යානුකූලව ඇවිල්ලා අපෙන් අවසර අරගෙන නැහැ. මේක නගර සභාවට අයිති ගොඩනැගිල්ලක්. එෆ්.අයි.ප්‍රනාන්දු මහත්තයා තමයි බේරුවල පළවෙනි නගරාධිපතිතුමා. එතුමාගේ බිරිඳ සිහිවටනයක් වශයෙන් තමයි බසියවත්ත ඉස්කෝලේ හැදුවේ. හදලා එතකොට හිටපු ආණ්ඩුකාරතුමා ඇවිල්ලා ගෙන්නලා තමයි මේක අපිට භාර දීලා තියෙන්නේ. ඒගොල්ලොන්ට අපි කිව්වා මේක සුහදව ඉවර කරගන්න පුලුවන් මේක රජයේ ගොඩනැගිල්ලක් රජයේ ඉඩමක්. මට දෙන්න බැහැ. මගේ නමට තියෙනවනම් මට දෙන්න පුලුවන්. මට ඕනේ මේ ප්‍රශ්නේ විසඳන්න.

**ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය**

එදා ඒක ඔප්පු කරන්න ලිපි ඉදිරිපත් කරලා තිබුනෙ නෑ.හාමුදුරුවෝ වැඩම කළානේ මෙතන්ට

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**

මම තමයි හාමුදුරුවන්ට එන්න කිව්වවේ.මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා විසඳුමකට එන්න.අපිට ඕන උනේ මේ ප්‍රශ්නය විසඳන්න.කෝ ඒ අය ආවේ නැහැනේ.මම ඒගොල්ලන්ට කිව්වේ ඕගොල්ලෝ අපිත් එක්ක ගිවිසුමකට එන්න. කෙච්චිමලෙ පල්ලිය ඇවිත් තියෙනවා වගේ.අපිට එතකොට සභාවට දාලා අනුමත කරලා දෙන්න පුළුවන්.වාශරීකව මුදලක් ගෙවන්න.එතකොට අපිට ලයිට් ,වතුර දෙන්න පුළුවන්.එහෙම නැතිව දෙන්න බැහැ. මේ කඩේ අයින් කරන්නත් පුළුවන්.

**<u>ගරු මන්ත්‍රිනී - එම්.ජේ.එච්.ඒ.පද්මකාන්ති මිය</u>**

ඒ අය කැමතිත් නෑ සභාපතිතුමා එතනින් අයින් වෙන්න.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**

ඒ අය එතනින් අයින් කරන්න පුළුවන් .සුහද සේවා හවුල අපිත් එක්ක ගිවිසුමකට ආවා නම්.ඒ අයට අපිත් එක්ක ගිවිසුමකට එන්න කියන්න එතකොට මම කඩ හිමිකරුව අයින් කරන්නම්.එතකොට අපිට එයාට කියන්න පුළුවන් ඔයා නීත්‍යානුකූලව නෙවෙයි ඉන්නේ.ඒ නිසා ඔයා යන්න කියලා.

**<u>ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය</u>**

නැවත සාකච්ඡා කිරීම සඳහා ඔබතුමාව මුණගැහෙන්න කියලා කියන්නම්.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**

ඔව් කියන්න.මම ලේකම් හාමුදුරුවන්ටත් කිව්වා ,නන්ද හාමුදුරුවන්ටත් කිව්වා.මම කිව්වා මේක මටවත් ඔබතුමියටවත් ලේකම්තුමාටවත් දෙන්න බැහැ කියලා.

**<u>ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා</u>**

ගරු සභාපතිතුමා,එතන කලින් තිබුනේ ක්ලින්ක් එකක්නේ.ඒක කවුද කරේ.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**

නගර සභාවෙන්.

**<u>ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා</u>**

ඒ කියන්නේ මේක සභාව සතුව තියෙන්නෙ.එතකොට සුහද සේවා හවුල කොහොමද මේකට සම්බන්ධ වෙන්නෙ.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**

ඉස්සර අසීස් මහත්තයා කියලා කෙනෙක් හිටියා. එයාට තමයි නගර සභාවෙන් මේක භාර දීලා තිබුනේ.මීට අවුරුදු 40 කට 50 කට කලින් .අසීස් මහත්තයාගේ දුව එතන මොන්ටිසෝරියක් කරා.එතන ලොකු ලොකු දේවල් කරේ නෑ මේ හොස්පිටල් එක හැදුවට පස්සේ ඒක මෙතනට ගෙනාවා.එදා ඉඳලා ඒ අය තමයි ඒක පරිහරණය කලේ.ඒ අයගේ මුලින් පොරොන්දුවක් තිබුණා නගර සභාවට ගානක් ගෙවන්න.නමුත් ඒක උනේ නෑ.පස්සේ ඒ දෙගොල්ලෝ අතර ගැටුමක් ඇතිවෙලා ඒ සම්බන්ධයෙන් නඩුවක් ගියා.නගර සභාව සම්බන්ධ උනේ නෑ.ඒ නඩුව තවම තියෙනවා. ඉවරයක් නෑ.අපේ ගොඩනැගිල්ල නගර සභාවට අයිති ඒත් අපේ කැමැත්තට දෙන්න බෑ.මුළු සභාවට එකඟ උනත් දෙන්න බෑ.රජයේ දේපළක් කොහොමද දෙන්නේ.

මේ සම්බන්ධයෙන් අපි අපේ හිටපු මහ ඇමතිතුමත් එක්ක සාකච්ඡා කළා.එතුමත් කිව්වේ මේක රජයට අයිති දෙයක් කාටවත් පවරන්න බෑ.ඒ ගොල්ලන්ට ගිවිසුමකට එන්න කියලා තමයි කිව්වේ.වතර්මාන ආණ්ඩුකාරතුමත් එක්කත් අපි මේ ගැන සාකච්ඡා කළා.පලාත් පාලන කොමසාරිස්තුමා එක්කත් හිටපු පළාත් පාලන කොමසාරිස්තුමියත් එක්කත් කතා කළා.එයා කිව්වේ මේක නඩුවකට යන්න කියලා.එතකොට මේකට විසඳුමක් එයි කියලා.මම කැමති නෑ නඩුවකට යන්න.

**<u>ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා</u>**

මේකට දැන් නඩුවක් තියෙනවද සභාපතිතුමා.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
අපිත් එක්ක නඩුවක් නෑ.

**<u>ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා</u>**
ඔබතුමා කියන්නෙත් මේක අපේ කියලානේ.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
මම නෙවෙයි ලිය කියවිලි වල එහෙම තියෙනවා.
**<u>ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා</u>**
මේ බේරුවල මිනිස්සු සාමයෙන් ජිවත් වෙන ගමක්නේ.මෙතුමාගේ අදහසට අනුව අපි මේක බදු ක්‍රමයකට දෙමු.පොඩි ගානක් අරගමු. මේ සභාවෙන් කෙච්චිමලෙ පල්ලියටත් මේ විදිහට ගිවිසුමකට ගිහින් තියෙනවානේ.ඒගොල්ලොත් මොනවා හරි හොඳ දෙයකට තමයි මේක දෙන්නෙ.මම කියන්නෙක් අපේ ගමේ තියෙන සංහිදියාව ශක්තිමත් කර ගන්න හොඳ තීරණයකට ඇවිත් අවුරුදු 33 කට හරි බදු ක්‍රමයකට යමු.

**<u>ගරු මන්ත්‍රී - එම්.එෆ්.එම්.හසන් මහතා</u>**
ගරු සභාපතිතුමා ,මේක එෆ් අයි ප්‍රනාන්දු මහත්තයා සභාවට පරිත්‍යාග කරපු භූමියක්.ඒක දීලා තියෙන්නේ පොදු වැඩකට.බේරුවල බෞද්ධ සංගමයට සභාව ගත්ත වැරදි තීරණයක් නිසා ඒගොල්ලන්ටත් මේකට මැදිහත් වෙන්න උනා. එෆ් අයි ප්‍රනාන්දු මහත්තයා මේ පරිත්‍යාග කරපු අරමුණ ඒකෙන් ඉෂ්ඨ උනේ නෑ
නමුත් ජේ.වී.පී මන්ත්‍රීතුමා කියපු විදිහට අපි එයාලත් එක්ක බදු බදු ක්‍රමයකට යන්න ඕන .ඒක අපේ නගර සභාවේ භූමියක්.අපේ අයිතිය තියාගෙන ඒගොල්ලන්ට ඒක දෙන්න.
ඒ ගොඩනැගිල්ල තියෙන තැන අනවසරෙන් නගර සදහා සභාවෙන් කඩයක් හදන්න ඉඩ දීලා තියෙනවා.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
මම එන්න කලින් ඉඳලා ඒ කඩය තියෙන්නේ.

**<u>ගරු මන්ත්‍රී - එම්.එෆ්.එම්.හසන් මහතා</u>**
අපි එන්න ඉස්සර නෙමෙයි එයා හිටියේ.නෑ ඒක නගර සභාවේ දීලා තියෙන්නේ.එයා අල්ලපු වත්තේ ඉන්නේ.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
එයා අල්ලපු වත්තේ ඉන්නෙ.

**<u>ගරු මන්ත්‍රී -එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා</u>**
එයා ඉන්නේ මායිමේ.

**<u>ගරු මන්ත්‍රී - එම්.එෆ්.එම්.හසන් මහතා</u>**
අපේ ඇතුලට එයා ආවා.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
ඔබතුමා ගිහින් බලන්න. එයා ඉන්නේ එයාගේ ඉඩමේ.

**<u>ගරු මන්ත්‍රී - එම්.එෆ්.එම්.හසන් මහතා</u>**
මම උපසභාපතිවෙලා ඉන්න වෙලාවේ ඔබතුමා තමයි ඒක හදාගන්න දුන්නේ.

**<u>ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා</u>**
එෆ් ආර් ගොඩනැගිල්ල අපේ සභාවේ වස්තුවක්නේ.ඒක හැම කෙනාම පිළිගන්නවානේ.ඒ ගොල්ලන්ව ගෙන්නලා කතා කරලා සුහදව අපි විසඳුමකට යමු.

**<u>ගරු මන්ත්‍රී -එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා</u>**

අපි දැන් ඒකට සාකච්ඡාවක් තිබුණානේ.ඒ රැස්වීම වෙලාවේ පොලීසියේ ඕ.අයි.සී මහත්තයාත් ආවනේ. එයා මේ නඩුව ගැන හොයාගෙන ආවා.

__ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා__
එදා ඒ රැස්වීමට හිටපු ඕ අයිසී මහත්තයාත් ආවා.එයා ඇවිත් ඔප්පුවකුත් ඉදිරිපත් කරා.නඩුවක විස්තරත් ඉදිරිපත් කරා.නමුත් ඒ නඩුව මේකට අයිති නඩුවක් නෙවෙයි.ලේකම්තුමා දන්නවානේද ඒ ගැන.ඒක මේකට අදාල ඔප්පුවක් නෙවෙයි.

__ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා__
නඩුවක් තියෙනවා කියලා කියමුකෝ.ඒත් ඒ නඩුව තියෙන්නේ සුහද සේවා හවුලත් එක්ක නෙවෙයිනේ.අපේ දෙයක්නම් අපිට නිකන් දෙන්න බැහැනේ.

__ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා__
අපේ ගොඩනැගිල්ල කියලා අපිට ඔප්පු කරන්න පුළුවන්. ඒ නිසා තමයි යහපාලන ආණ්ඩුව හෙල බොජුන් හලක් හදන්න රාජිත මහත්තයා ලක්ෂ 40 ක් වෙන් කරේ.එදා සංවධර්න කමිටුවේදි තීරණය කළා වහාම නගර සභාවෙන් ඒක ප්‍රතිසංස්කරණය කරන්න කියලා.ඒක කරන්න නගර සභා සේවකයෝ යැව්වම තමයි ඒගොල්ලෝ ඇවිල්ලා බුදු හාමුදුරුවන්ගේ පිළිමයක් එතන තිබ්බේ.ප්‍රශ්නයක් ඇති කළා.

__ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා__
මේ විදිහිම තමයි අපේ බීච් ග්‍රවුන්ඩ් එකත්.අපේ තියෙන දේවල් වෙන වෙන කට්ටිය අල්ල ගන්නකන් අපි බලාගෙන ඉඳලා වැඩක් නෑ.අපි නගර සභාවේ ඉන්නේ ඒකටනේ අපේ දේවල් රැකගන්න ඕනනේ.නගර සභාවට මේක තියෙනවා නම් ඒගොල්ලෝ නගර සභාවත් එක්ක තමයි ගිවිසුමකට එන්න ඕන.ෙ

__ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා__
ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය අපි දිගටම ඇදගෙන යන එක තේරුමක් නෑ.අවසාන වශයෙන් අපේ සභාවේ තීන්දුව ඒගොල්ලන්ට කියන්න ඒ අයට නගර සභාවත් එක්ක තීන්දුවකට එන්න කියන්න.එතකොට අපිට උදව් කරන්න පුළුවන්.
මරදාන වැරටි එකෙන් අපිට ලිපියක් එවලා තියෙනවා.මේ කට්ටිය දින දෙක තුනකට කලින් ඇවිල්ලා මාව හම්බ උනා.
අපේ මරදාන ජිම් එකත් අපි ඉක්මනට පටන් ගන්න ඕන .මම පොරොන්දු වෙලා ආවා ජිම් එකත් ඉක්මනට පටන් ගන්නවා කියලා.ලක්ෂ 35 පමණ වියදම් කරලා අපේ සභාවෙන් ගොඩනැගිල්ල හදලා තියෙනවා .ඒක නිකං තියාගෙන හිටියට අපිට ඔඩිට් කුවරියක් එනවා.රාජිත ඇමතිතුමා ලක්ෂ 10 ක විතර බඩුත් ඒකට දීලා තියෙනවා.මට රාජිත ඇමතිතුමා මුණ ගැහුණු වෙලාවක මම කිව්වා ඒ උපකරණ මදි කියලා .එතුමා කිව්වා ඉල්ලීමක් කරන්න කියලා.එතකොට එතුමා දෙන්නම් කිව්වා. මම නෙවෙයි ඉල්ලීම කරන්න ඕන .එතුමාගේ පක්ෂයේ කට්ටිය ඉල්ලීම කරන්න ඕන.
මේ වැරිටි එකෙන් කරපු යෝජනාව හොඳ යෝජනාවක්.මජර්ාන් මහත්තයාත් මේකට සල්ලි වෙන් කරන්න ලෑස්ති වෙලා ඉන්නේ.ජිම් එකේ උඩ තට්ටුව හදන්න ලක්ෂ 20 ක මුදලක් එතුමත් වෙන් කරලා තියෙන්නේ මේ වැඩේ කරන්න.මරදාන වැරිටි එකත් ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධයෙන් .මොකක්ද අපි ගන්න තින්දුව.

__ගරු මන්ත්‍රී -අහමඩ් දිල්සාත් මහතා__
මේ සම්බන්ධයෙන් මම ටිකක් කතා කරන්නම්.සියළු දෙනාගෙන්ම අවසරයි.මරදාන වැරිටි එක ගැන මම ටිකක් විස්තර කරන්න ඕන.මේගොල්ලෝ රාජ්‍ය නොවන සංවිධානයක් වගේ තමයි මේක පටන් ගත්තේ අවුරුදු 04 කට කලින්.මේගොල්ලන්ගේ පළවෙනි ව්‍යාපෘතිය තමයි කොවිඩ් එකට මේගොල්ලෝ එකතු කළා ලක්ෂ 90 ක්.ඒ කාලේ පාසර්ල් 6000 ක් විතර බෙදුවා.ඒ අයගේ පළවෙනි ප්‍රොජෙක්ට් එක සාථර්ක උන නිසා ගමේ කට්ටියට ලොකු විශ්වාසයක් ඇති උනා මේ අය සම්බන්ධයෙන්.මේ අයගේ වට්ස් අප් ග්‍රෑප් එකේ මෙම්බසර්ලා 260 වැඩිය ඉන්නවා.හොඳ විශ්වාසයක් ඒ අය ගැන තියෙන නිසා මේ අය කිව්වොත් ඔක්කොම සල්ලි දානවා.

දෙවනි ප්‍රොජේට් එක විදිහට නාගොඩ හොස්පිටල් එකේ වාට්ටු අංක 05 ට. ඒකට ලක්ෂ 20 ක් විතර ඒ අය වියදම් කළා.ඒගොල්ලෝ මිලියනක් විතර එකතු කරලා කොවිඩ් කාලේ ඔක්සිජන් ටැංකි ගෙනාවා.අන්තිම ප්‍රොජේට් එක තමයි අල් ෆාසියාතුල් නසරියා කාන්තා විදුහලේ වොලන්ටියර් ටීචර්ලට මාසෙකට රුපියල් 10,000.00 ගානේ ටීචර්ලා 09 දෙනෙකුට පඩි ගෙවනවා.ඒ වගේම පිරිමි විද්‍යාලයේ ටීචර්ලටත් ගෙවනවා.ලක්ෂ 02 කට ආසන්න ගානක් ඒ අය මාසෙකට වියදම් කරනවා.
මරදාන ජිම් එක අවුරුදු 04 ක් විතර වහලා තියෙනවා.මම ඒක උඩ තට්ටුවට ලයිබ්‍රරි එක හදන්න ලක්ෂ 40 ව්‍යාපෘති වලට දැම්මා.නමුත් ඒක බිල්ඩින් හදන්න බැහැ කියලා ආණ්ඩුවෙන් සකර්යුලර් එකක් ආවා.දෙවනි සකර්යුලර් එකට අනුව ස්වයං රැකියා වලට වෙන්කරන්න කියලා කිව්ව නිසා මම ඒක හදලා ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට භාර දුන්නා. ඒ අනුව මජරින් මහත්තයාගේ ව්‍යාපෘති වලිනුත් ඒක කරන්න බැහැ. තව ව්‍යාපෘතියකින් සල්ලි ආවා ඒක මම පාරවල් හදන්නයි බෝක්කු හදන්නයි යොදවලා තියෙනවා.ආණ්ඩු ජනතාවට මුක්තු කරලා නෑ. සභාවෙන් කරපු ටිකක් විතරයි තියෙන්නේ ඒත් තවමත් ජනතාව විශ්වාසයෙන් ඉන්නවා. තව අපිට අවුරුද්දයි මාස 02 යි තියෙන්නේ.මරදාන වැරිට් එක මිලියන2.5 ක් වියදම් කරන්න ලෑස්ති වෙලා ඉන්නවා එතනට.ගරු සභාපතිතුමා බේරුවල ෆුට් බෝල් ලීග් එකේ ටිම්ස් 04 යි රෙජිස්ටර් වෙලා තියෙන්නේ.ලයිට් හවුස් ෆුට් බෝල් ටීම්,ලයිට්හවුස් ,ඇරබියින් කියන ඒවා.මේ අයගේ මාසෙ රැස්වීම පවත්වන්න තැනක් නැහැ.බී. ආර් වෙඩින් හෝල් එකේ තමයි සමහර වෙලාවට රැස්වීම් පවත්වන්න.ඒකත් වෙඩින් එකක් වෙලාවට දෙන්නේ නැහැ.ඒ වගේම පොදු තැනකුත් නැහැ කට්ටිය 100 ක් 150 ක් විතර අයට රැස් වෙලා ඉන්න පුළුවන් තැනක් මේ ගොල්ලන්ට නැහැ.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>

එඟ් අයි බිල්ඩින් එකත් සුහල සේවා හවුල ඉල්ලන්නේ එහෙම එකකට තමයි.

<u>ගරු මන්ත්‍රී -අහමඩ් දිල්සාත් මහතා</u>

අපිට මේකෙන් පොඩි වාසියක් වෙනවා.රු 2500 ක් සභාවට ගෙවන කොට ඒක සභාවට ආදායමක් වෙනවා.ඒ ගොඩනැගිල්ලත් එකක් නගර සභාවට අයිති ඉඩමක් තියෙනවා.මේගොලේලෝ කැමතියි ඒකට උඩින් ස්ලැබ් එකක් දාලා අපිට දෙන්න .එතකොට පල්ලෙහා කඩවල් 03 ක් නැත්නම් දෙකක් විතර හදල දෙන්න පුළුවන්.මේක හැදුවා කියලා අපිට පාඩුවක් වෙන්නේ නැහැ.මේ හෝල් එකෙන් අපිට හොඳට ප්‍රයෝජන ගන්න පුළුවන්.කවුරු හරි මේකට විරුද්ධ වෙනවා නම් මට කියන්න තියෙන්නේ අපේ කාලේ මුකුත්ම වුනෙත් නැහැ. වෙන්නෙත් නෑ.ඉදිරියට කියලා මම නිහඬ වෙනවා.

<u>ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය</u>

ආණ්ඩුවෙන් අපිට ලක්ෂ 40 ක් දෙනවා කියලා තිබුණානේ.දැන් ඒගොල්ලෝ ඒ තිරණ එක එක වෙලාවට වෙනස් කරනවා.ප්‍රාදේශීය ලේකම් කායර්ාලයෙන් මේ විනාඩියට දෙකට කියනවා වෙනස් කරලා දෙන්න කියලා මේ ගැන මම සභාපතිතුමාට කිව්වා.ආණ්ඩුවේ කිසිම ප්‍රතිපත්තියක් නැහැ.පස්සේ කියනවා මටයි උස්මාන් මන්ත්‍රිතුමාටයි තියෙන්නේ ලක්ෂ 08 .ලක්ෂ අටකින් මොනවද කරන්න පුළුවන්.බහු ආසනයක් උනත් අපි දෙන්නාම ඡන්දයක් දිනලානේ ආවේ.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>

හැම ආණ්ඩුවක්ම ඔය වගේ.

<u>ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය</u>

හැම ආණ්ඩුවක්ම මේ වගේ නැහැ.මුලින් ලක්ෂ හතලිහයි. ඊට පස්සේ ලක්ෂ 20 ක් කියනවා.ආයෙත් ලක්ෂ අටයිලු.ස්වයං රැකියා ගන්න කට්ටිය ගානක් ගෙවන්න ඕන ආණ්ඩුවට.ඒ වගේ තත්ත්වයක් මිනිස්සුන්ට අද නැහැ.මිනිස්සුන්ට අමාරුයි.

<u>ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා</u>

සල්ලි එන්න කලින් වැඩ පටන් අරන්.

<u>ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය</u>

සමහර ප්‍රාදේශීය ලේකම් කායර්ාලයේ සල්ලිත් නෑ.

<u>ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා</u>
මීට කලින් ආණ්ඩුවෙන් සල්ලි ආවම තමයි වැඩ පටන් ගන්නේ.මේ ආණ්ඩුව සල්ලි එන්න කලින් නැකත් බලලා වැඩ පටන් ගන්නවා.වැඩපටන් ගන්නවාත් නෙවෙයි පටන් ගන්නවා වගේ පෙන්නනවා.

<u>ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය</u>
ප්‍රාදේශිය ලේකම් කායර්ාලයෙන් අපිව දැනුවත් කරෙත් නෑ.ඒත් ඒ අය කියනවා කිව්වා කියලා.මම කිව්වා අපිට දැනුම දීමක් කරන්න ඒන .එතකොටනේ අපිට ඒවා හදලා දෙන්න පුළුවන්.අපිටත් රාජකාරි තියෙනවා. විනිවිදභාවයක් තියෙන්න ඕන.සමහර විට අපේ යෝජනා නැතිව ඒගොල්ලන්ට යවන්න තිබුණා.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
අපි ඒක ගැන හොයලා බලන්නම් .

<u>ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා</u>
ඔබතුමා මරදාන වැරිටි එකෙන් දාපු යෝජනාව ඉතාමත් වටිනා යෝජනාවක්.දිල්සාත් මන්ත්‍රීතුමා අපේ කොට්ඨාසයේ මන්ත්‍රීතුමා.අපි ඔක්කොම එකතු වෙලා මේකට සහයෝගය දෙමු.
එම්.ඒ බාකීර් මාකර් මහත්තයා ඉන්න කාලේ එතුමා එතන ප්‍රජා ශාලාවක් තමයි හැදුවේ. ඒක කාලෙන් කාලෙට වෙනස් වෙලා තමයි ජිම් එකයි පුස්තකාලයයි ආවේ.අපිට වැරටි සංවිධානයෙන් ඇවිල්ලා ඒගොල්ලෝ කියනවා අපේ ගමේ මිනිස්සුන්ගේ ප්‍රයෝජනයටත් නගර සභාවේ වැඩ කටයුතු වලටත් පොදු වැඩ කටයුතු වලටත් මේ ප්‍රජා ශාලාව ප්‍රයෝජනවත් වෙනවා.අපි ඒ අය උදව් කරන්න ඉන්න එක සාධරයෙන් පිලිගන්න ඕන. ඒගොල්ලෝ අතින් වියදමක් දරලා ඒ වැඩේ කරන නිසා අපි ඒගොල්ලන්ට ශක්තියක් දෙන්න ඕන.
අපි ගුරුවරු 16 ක් එක්ක තමයි ඉස්කොලේ ගෙනියන්නේ.ළමයි 630 ක් ඉන්නවා.මේ අවුරුද්ද ඉවර වෙනකොට ළමයි 810 ක් වෙනවා.අපිට ගුරුවරු 16 ක් විතර අඩුයි.ඒගොල්ලෝ ගුරුවරු 14 දෙනෙක් අපිට දීලා තියෙනවා.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
දැන් අර තට්ටු තුනේ බිල්ඩින් එක මොකද උනේ. ඒක හදනවද.

<u>ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා</u>
ආණ්ඩුවෙන් ඒකට ස්ට්‍රක්චර් එක අනුව අපි වැඩේ පටන් ගත්තා. එහේ තෙන්නකොන් මහත්තයාගේ සොයිල් රිපෝට් එක අනුව අපි බැලුවා අඩි 10 ½ ගැඹුරයි. දිග 40 කට කොන්ක්‍රිට් එක දාන්න ඕන.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
වෙත්තිමිරාජපුර ඇළ අයිනෙන් නේද යන්නෙ.

<u>ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා</u>
අඩි 10 ½ යි ගැඹුර. දිග අඩි 40 යි. ඒක අපි අඩි 12 ක් විතර අඩි 10 ½ ට වළ කැපුවා. කැපුවට පස්සේ අපිට තේරුණා උඩ පැත්තෙන් තට්ටු 03 බිල්ඩින් එක එනවා. අනිත් පැත්ත ටිකක් කන්ද තියෙන්නේ. අනිත් පැත්තෙන් ඇළ මාගර්ය තියෙන්නේ. අන්න ඒ නිසා ඒගොල්ලො දීපු ස්ට්‍රක්චර් එක අනුව අපි ඒක කරන්න පටන් ගත්තොත් ඒක ලක්ෂ 400 කින් තමයි ඉවර වෙන්නේ. අතන වළ හැරුවට පස්සේ ගමේ තියෙන ඔක්කොම අතනට තමයි එන්නේ.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
කවදද පටන් ගන්නේ. ජනවාරි ඇතුළත පටන් ගත්තා නම් දෙසැම්බර් වෙනකොට ඉවර කරන්න පුලුවන්. ඒකට ආධාර කරන කට්ටියගේ සල්ලි ලෑස්තියි. ඒ නිසා ඒක ඉක්මනට පටන් ගන්න.

<u>ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා</u>
ඒක හරි පිළිවෙළට කරන්න සිස්ටම් එකක් තියෙනවනම්, ඒ සිස්ටම් එකට අනුව අනුමැතියක් ගත්තා නම් හරි.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>

අනුමැතිය අරගන්නකෝ ඉක්මනට.

<u>**ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා**</u>
දිල්සාත් මන්ත්‍රීතුමා කිව්වා වගේ බදු ක්‍රමයකට මාසෙට රු.2500.00 ක් වගේ නගර සභාවට ඒගොල්ලෝ ගෙවයි. ඒගොල්ලෝ සම්පූණර්වම ඒක නඩත්තු කරයි.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>
බද්ද අපිට දැන්ම තීන්දු කරන්න බැහැ. සාධාරණ ගාණක් නගර සභාවට අය වෙනවා කියලා, අපි ඊට ඉස්සර පාලරීමේන්තු මන්ත්‍රීතුමත් එක්ක මේ ගැන සාකච්ඡා කරමු. මේක හොඳ යෝජනාවක් ගෙනාවේ. එතුමත් එක්කත් අපි ඔක්කොම සාකච්ඡා කරලා තීන්දුවකට එමු මේක කෙහොමද කරන්නේ කියලා.

<u>**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**</u>
ඒ බිල්ඩින් එකට මුලින් කොහොමත් ඉංජිනියරින් ප්ලෑන් එකක් දාන්න ඕනනේ. මුලින් ඒකෙන් පටන් ගන්න.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>
ඔව් ඒක කරන්න පුලුවන්. මුලින් අපි ලබන සභා වාරෙට මේක තියාගමු තීන්දුවක් ගන්න. මේ සභා වාරයේදි ලබන සභාවාරය වෙනකන් අපි ගරු පාලරීමේන්තු මන්ත්‍රීතුමත් එක්ක එකතු වෙලා තමයි අපි හැම වැඩක්ම කරන්නේ.

එක්කෝටි අනූ ලක්ෂයක් දැන් වෙත්තිමරාජපුර ඇළ මාගර්යේ කොටසක් හදන්න කොහොම හරි පාස් කරගත්තා. වෙත්තිමරාජපුර පාර කාපට් කරන්නත්, අබ්දුල් මුයිස් මාවත පාර කාපට් කරන්නත්, යසීර් අෆර්ත් මාවත කාපට් කරන්නත්, තවත් පාරවල් 08 ක් කාපට් කරන්නත් මුදල් වෙන් කරලා තියෙනවා.
පාරවල් 12 ක් කාපට් කරේ මේ අවුරුදු 02 ට බේරුවල නගර සභාවේ විතරයි. ඒ පාරවල් වල නම් මම මෙතන මතක් කරලා වැඩක් නැහැනේ. ඒවට අපිට උදව් කරේ මජර්ාන් ෆලීල් මැතිතුමා. ඒක මතක තියා ගන්න. ඒක හින්දා මේ සම්බන්ධවත්, ජිම් එකේ වැඩ ටික සම්බන්ධවත්, ඒ සාකච්ඡාවට එයාගෙනුත් අපි අනුමැතිය අරගෙන එයත් සල්ලි වගයක් වෙන් කරලා තියෙනවා ඒකට. ඒකත් සාකච්ඡා කරලා යට තට්ටුව එයාගෙන් මුදල් වෙන්කරගෙන අපි හොඳට වැඩේ කරගමු.

<u>**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**</u>
මං කියන්නේ සභාපතිතුමා, මේකෙ කිසිම ප්‍රශ්නයක් නැහැ.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>
ඒගොල්ලෝ මාත් එක්ක ඇවිල්ලා සාකච්ඡා කරා. යෝජනාව හොඳයි සීයයට සියයක්. මාත් එකඟයි. ඒක ප්‍රශ්නයක් නැහැ. නමුත් පාලරීමේන්තු මන්ත්‍රීතුමත් එක්කත් අපි සාකච්ඡා කරලා එකඟතාවයකට යමු.

<u>**ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා**</u>
ගරු සභාපතිතුමා, ඔබතුමත්, මේ සභාවෙනුත් එකඟයි. දැන් ඒගොල්ලෝ බලන්නේ මේ මොහොතේ මේක පටන් අරන් ඒක කරන්නේ නැහැ.ඒ නිසා ගරු සභාපතිතුමා, අපි මේ සභාවෙන් අපි අවසරය දෙමු. මගේ අදහසක් විදියට මම මේක කරන්නේ. අවසර දීලා මේක පටන් ගමු. අපි මේ මජර්ාන් ෆලීල් මහත්තයත් එක්ක අපේ මන්ත්‍රීතුමත් එක්කත් සාකච්ඡා කරමු.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>
ඒක තමයි කියන්නේ අපි මුලින් තීන්දුවක් ගන්නට ඉස්සර, ආණ්ඩුවේ බලධාරියෙක් ඉන්නවා. බලධාරියා තමයි පාලරීමේන්තු මන්ත්‍රීතුමා. එතුමගේ සහයෝගයත් අරගෙන අපි මේ වැඩේ පටන් ගමු. මම කියන්නේ නැහැ මේක නවත්තන්න ඕන කියලා. අපි එතුමව අයින් කරලා හිතුමනාපෙට කරන වැඩක් නෙමෙයි මේක. මේක රජයේ ආයතනයක්. මේක රජයේ ගොඩනැගිල්ලක්.වැරිටි සංවිධානයෙන් මේක කරගමු.අපි මේ කට්ටියත් එක්ක සාකච්ඡා කරලා තීන්දුවකට එමු.

<u>**ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා**</u>

ඒක හොඳයි සභාපතිතුමා,

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>

අපි ලබන සභාවාරෙට තියාගමු.ඊට කලින් අපි පාලරීමේන්තු මන්ත්‍රිතුමා හම්බවෙමු.

<u>**ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා**</u>

අපි වැරිටි එකට දෙමු කියලා අපි යෝජනා ස්ථිර කරගමු.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>

හරි .පාලරීමේන්තු මන්ත්‍රිතුමාත් එක්ක සාකච්ඡා කරලා තීන්දුවකට එමු.
අපේ යෝජනා වල තියෙනවා.ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලයෙන් අපේ සැළසුම් කමිටුවට නියෝජිතයෙක් පත් කරන්න කියලා යෝජනාවක් තියෙනවා. එහෙම කෙනෙක් ඕනෙද? ඇත්තටම අවශ්‍ය නෑ එගොල්ලන්ට ගානක් ගෙවන්න.මෙච්චර කල් කරා වාගේ කරමු. ඕන නෑ.

<u>**ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා**</u>

ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ගෙවීම් වලට අනුව1.5 කෙරවල පිටියට කසල ගෙන යන එක ගැන පැහැදිලිව සඳහන් කරන්න.දින ගනන අනුව වෙන වෙනම.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>

ඒකෙ දින ගනන සඳහන් කරලා නැවත සකස් කරලා වාතර්ාවට ඇතුලත් කරන්න.ෆයිබර් කොටස් අපෙන් මිළදී ගෙන

<u>**ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා**</u>

මේකෙ තියෙනවා මධ්‍යම යාන්ත්‍රික වැඩපොලේ ෆයිබර් කොටස් ඉවත් කිරීමට මුදල් ගෙවලා ඒ ෆයිබර් වලට මොකද කරන්නනේ.

<u>**ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා**</u>

ෆයිබර් කොන්ත්‍රාත්කරු අරන් ඒවා විනාශ කරනවා.

<u>**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**</u>

ගරු සභාපතිතුමා,අපේ බල ප්‍රදේශයේ පාරවල් සලට සකස් කරපු නාම පුවරු මෙහෙට ගෙනත් තියෙනවා.තවම සවි කරලා නෑ.අපි කලින් සභාවකදී ඒකට ඒක කරන්න තීරණය කළා.ඒකට මුදලකුත් අනුමත කළා.අපදාදෙනේ මේ නගර සභාවේ සල්ලිනේ.අන්තිමට අපි තීරණය කලේ අපේ මෙහේ ඉන්න සේවකයෝ යොදවලා මේක කරන්න.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>

ගාන වැඩි කරලා අපි ඒක කරන්න අනුමත කළා.ඒ නගර සභාවේ සල්ලි .නගර සභාවෙන් වෙන්න ඕන අත්‍යවශ්‍ය සේවාවක්.එස් ඩබ්ලිව් මහත්තයා.මොකද කරන්නේ .එක්කෙනෙක් ඉදිරිපත් වෙලා ඉන්නවානේ මේක කරන්න.වැඩි ගානකට.ඒ ගාන අපි අනුමත කරලා දුන්නානේ. නැවතත් ඇයි දැන් ඉදිරිපත් වෙන්නේ නෑ කියලා කියන්නෙ.

<u>**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**</u>

අපේ සභා සේවකයෝ යොදවලා මේක කරන්න බැරිද?අච්චු ඔක්කොම තියනවානේ.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>

අපේ ලඟ අච්චු නැහැ. කොන්ත්‍රාත් කට්ටිය ලඟ තමයි ඒක තියෙන්නේ. අපි ලඟ තිබුණානම් අපි මේ වෙනකොට හදලා.අපි අච්චුවක් හදලා මේක හදමු.මේක කරන්න කියලා දැන් අවුරුද් දෙකක් තිස්සේ කතා වෙනවා.ලබන සභා වාරයට කලින් අච්චුවක් හදලා අපේ කට්ටිය දාලා වැඩේ පටන් ගන්න.ලේකම්තුමා ඒ ගැන හොයලා බලන්න.

මාධ්‍යවේදීන් ඉල්ලීමක් කරලා තියෙනවා ඒ අයට සභාවෙන් දෙන දීමනාව සභාවට පැමිණෙන මාධ්‍ය වේදීන්ට විතරක් ගෙවන්න කියලා.කොහොමත් එන්නේ නැති අයට දෙන්නේ නැහැනේ.අපි සභාවට එන මාධ්‍ය වේදීන්ට විතරක් දෙමු.

<u>ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරුස් මහතා</u>

ගරු සභාපතිතුමා ,මගේ යෝජනාවක් විදිහට මම කියන්නේ.මේ මාධ්‍යවේදීන් තුන්දෙනාම තමයි එන්නේ.සමහර වෙලාවට මොකක් හරි අපහසුතාවයක් නිසා එන්න බැරි උනොත් හැර ඒ තුන්දෙනා හැමදාම එන අය. ඒ නිසා ඒ තුන්දෙනාටම දෙන්න.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>

හැමෝම කැමතියිද ඒකට.නැවිත් හිටියොත් දෙන්නේ නැහැ.එහෙම උනාම ඒ අය නැවිත් ඉඳලා දිමනාව ගනියිනේ.

<u>ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා</u>

ආවේ නැත්නම් එන්නේ නැති එක ගැන කියලා ලියුමක් දෙන්න කියන්න.

<u>ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා</u>

ගරු සභාපතිතුමනි.බේරුවල පරණ කඩේ බෝගල්ල පාර සකස් කිරීම සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙනවා.ඒ පාර මමයි විමධ්‍යගත මුදල් අරන් හදන්න හැදුවේ . නමුත් ඒක කුමාර වෙල්ගම මහත්තයා මුදලක් වෙන් කරලා තිබුණ නිසා මගේ යෝජනා අවලංගු උනා.ඒ උනාට කුමාර වෙල්ගම මහත්තයාගේ මුදල් වලිනුත් පාර භාගයයි හදලා තිබුනේ.සම්පූණර් පාර හදා ගන්න බැරි උනා. ගමේ මිනිස්සුත් දෙකට බෙදිලා .අන්තිමට එක කොටසක් කළා.අනිත් කොටස ඔබතුමා අවසන් කිරීමට පියවර ගැනීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා.ප්‍රදේශයේ මන්ත්‍රීවරයා හැටියට.මම පසුගිය සභාවාරෙදිත් සාකච්ඡා කළා.රේගුව හරස් පාර කාපට් කිරීම සම්බන්ධයෙන් .මේ පාරේ විශාල වලවල් සංඛ්‍යාවක් තියෙනවා.මේක කරන්නේ නගර සභාවෙන්.මේක තාරදාලා හදනවද කියලා ඒත් මේ පාර හදන්න ඕන.බණ්ඩාරවත්ත සිල්ලිය ලඟට යනකම් වලවල් තියෙනවා.
ඒ වගේම පහුගිය සම්බන්ධිකරණ රැස්වීමට මම යෝජනා 03 ක් ඉදිරිපත් කළා.ඒ තුනම සාකච්ඡා කරේ නෑ.පාරවල් කාපට් කරන්න දැම්මට ඒවා කෙරෙන්න නෑ.ඇමතිතුමාගේ කාන්තා සංවිධාන වල වැඩ කටයුතු ගැන තමයි කතා කරේ.සභාපතිතුමා ආදාහනාගාරය ගැන කතා කරා විතරයි ඒ ගැන ඊට වඩා කතා කරේ නෑ.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>

ප්‍රාදේශිය සභාවේ සභාපතිතුමා යෝජනාවක් දාලා තිබුණා සංවධර්න කමිටුවට.අපිට තියෙන්නේ එකම එක සොහොනක් විතරයි .ඒ කුරුඳුවත්තේ.ඒක අපිට ලබා දෙන්න කියලා.අපිට ඒක විතරයි තියෙන්නේ. ඕගොල්ලන්ට කිහිපයක් තියෙනවා.

<u>ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය</u>

එතන ගැටළුවක් තියෙනවානේ සභාපතිතුමා, හැමදාම කතා කළාට මොනවත් වෙන්නේ නැහැනේ.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>

අපිට තියෙන දෙයක් එහෙම දෙන්න බැහැනේ. අපි නගර සභාව පටන් ගත්ත දවසේ ඉඳලා පිටවල සුසාන භූමිය.ඒක අපිටම තියාගන්න ඕන නිසා ඒ ගැන අපි ඉල්ලීමක් කරලා පියල් ඇමතිතුමාට ලිපියක් යවමු.වැඩිදියුණු කරන්න අපි ඉල්ලන්නේ. කොරෝනා ඇවිත් අපිට කිසිම දෙයක් කරන්න බැරි උනානේ.

<u>ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය</u>

සජිත් මන්ත්‍රීතුමා 2000 අවුරුද්දේ දිද ඊට කලින්ද මට මතකනෑ මේ ගැන යෝජනා කළා.අද වනතුරු කවදද මේවා කරන්නේ.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>

ලේකම්තුමා පියල් ඇමතිතුමාටයි මජරින් ඇමතිතුමාටයි ප්‍රාදේශිය සභාවේ සභාපතිතුමයි ලිපියක් යවන්න මේ සොහොන බේරුවල නගර සභාවට තමයි තියෙන්න ඕන කියලා.

ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය

ඒ වගේම ප්‍රතිපාදන වෙන් කරන්න කියන්න මේක හදන්න.

ගරු මන්ත්‍රී - එම්.එෆ්.එම්.හසන් මහතා

කෝටි හැත්තෑ පහ තවම මග එනවා.

ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා

කෝටි හැත්තෑ පහ අපිට දෙනවා කිව්වේ ඉන්දියාවෙන්.ප්‍රදානයක් හැයියට ඒ ඩී බී බැංකුවෙන්.අවුරුදු දහයකට විස්සකට විතර පස්සේ රජයෙන් තමයි ඒගොල්ලන්ට ඒක ගෙවන්නේ.නගර සභාවෙන් අපි ඒ ව්‍යාපෘති වලින් ආදායම් උත්පාදනය කරන්න ඕන.කොරෝනා නිසා ඒ සල්ලි ආවේ නෑ.නැත්නම් ඒ සල්ලි වලට අපි මෙහේ රුස්වීම් තියලා ඕගොල්ලන්ව ගෙන්නලා ඒ ගැන සාකච්ඡා කළා.ඒ රටට දැඩි ලෙස කොරෝනා බල පෑවා ඒ නිසා ඒක කැන්සල් කළා .සමහර විට ඉදිරියේදී ඒ සල්ලි නැවත එන්න පුළුවන්.

වෙරළ උද්‍යානයට කෝටි අටක් අපිට අනුමත වෙලා තියෙනවා.එදා සංවධර්න කමිටුවේදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා උනා.ගැටළුවක් ආවා වෙරළ උද්‍යානය සංවධර්නය කරන කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය දී ඇති බවත් කොමසාරිස් ජනරාල් මගින් ඉඩම පවරා ගැනීමට කටයුතු සිදුකරමින් පවතින බවත් නාගරික සංවධර්න අධිකාරිය මගින් මෙහිදී ප්‍රකාශ කරන ලදි.මෙම ඉඩම සම්බන්ධයෙන් වෙරළ සංරක්ෂණ දෙපාතර්මේන්තුවේ එකඟතාවය ලැබී ඇති බවත් නාගරික සංවධර්න අධිකාරියට පවරා දීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්ලේ අනුමැතිය ඉල්ලා ඇ බවත් ප්‍රාදේශිය ලේකම් විසන් ප්‍රකාශ කරන ලදි.මේ සම්බන්ධව 2022 .01.11 වන දින විමසීම් කරන ලදුව බේරුවල නගර සභාව සතුව ඇති ප්‍රකාශන ඔප්පුව අවලංගුකැ ගැනීම සඳහා සන්තකය ලබා ගැනීමේ පනත යටතේ 26637/ 2021 දරණ නඩුව පවරා ඇති අතර එය 2022 05.22 වන දින කළුතර මහේස්ත්‍රාත් අධිකරණයේ කැඳවීමට නියමිතව ඇත.තීන්දුව ලැබෙන තෙක් ඉදිරිවැඩ පැවරීමේ කටයුතු සිදුකිරීමට නොහැකි බව බේරුවල ප්‍රාදේශිය ලේකම් කායර්ාලය විසින් දැනුම් දෙන ලදි.මේ ප්‍රකාශන ඔප්පුව අවලංගු කරන්නේ නැතිව යූ ඩී ඒ එකට වැඩ කරන්න බැහැ. ඒ නිසා අපෙන් ඉල්ලුවා ප්‍රකාශන ඔප්පුව අවලංගු කරන්න කියලා.මම කිව්වා යුඩීඒ එකෙන් ලිපියක් එවන්නේ නැතිව අපිට ප්‍රකාශන ඔප්පුව අවලංගු කරන්න බැහැ.ඒගොල්ලෝ ලිපියක් එවලා තියෙනවා.අපේ එකඟතාවය දුන්නොත් ඒ අය අපිට නඩත්තු කටයුතු දෙනවා කිව්වා.ඒ ගැටළුව ඉවරයි.ඒගොල්ලෝ අපිට නඩුවක් දාලා තියෙනවා .නඩුව ඉල්ලා අස්කරගන්නවා කිව්වා.අපේ ප්‍රකාශන ඔප්පුව අපි කැන්සල්. කලා නම්.මේක තියාගෙන මේක අපේ අපේ කිව්වට වැඩක් නැහැ.අපි ප්‍රකාශන ඔප්පුව අවලංගු කරලා යූඩීඒ එකට දෙමු. ඒගොල්ලන් ඊට පස්සේ අපිට දෙයි.අපි එහෙම කරමු.මේකට මන්ත්‍රීවරු කැමතියිනේ.ඒකට ලිපියක් යවන්න.

ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා

කුරුඳුවත්ත සොහොන ළඟ තයෙන කාණුව පිරිසිදු කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා සභාපතිතුමා.

ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා

ඒක ප්‍රාදේශිය සභාවට කියන්න ඕන.

ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා

නගර සභාව පැත්තට අයිති කොටසේ තියෙන කාණුව

ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා

සොහොන ළඟ ඉස්සරහ තියෙන්නේ ජාමියා නලිමියා පාර .ඒ පාර ප්‍රාදේශිය සභාවට තමයි අයිති.ප්‍රාදේශිය සභාවෙන් තමයි කුණු ගත්තේ.මේනක සභාපතිතුමා ආවට පස්සේ තමයි කුණු ගන්නේ නැත්තේ.ඒ නිසා සභාපතිතුමාට කියන්න නුනු ගන්න කියලා.ඒ විතරක් නෙවෙයි.සොහොනත් එක්කම අතුරු පාරක් යන්නේ.පන්නිල පාර.ඒ පාරෙත් ගෙවල් ගොඩක් හැදිලා .දැන් ඒ අය ඉල්ලීමක් කරලා තියෙනවා ඒ පාරේ කුණු ගන්න කියලා.ඒකත් ප්‍රාදේශිය සභාවට අයිති.එතන ඉස්කෝලෙකුත් තියෙනවා.

**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**
මම කියන්නේ සභාපතිතුමා අපේ මායිමේ බෝක්කුව ,හසන් හජ්ජියාගෙර් ගේ ඉස්සරහ ඉඳලා විස්ඩම් දක්වා කාණුව අපේ.ඒ කානුව පොඩ්ඩක් ශුද්ධ කරලා දෙන්න.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
හරි ඒක සුද්ධ කරලා දෙන්නම්.

**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**
ලක්ෂ 40 ව්‍යාපෘති වලින් නස්මි මන්ත්‍රීතුමා ඒක හදන්න සල්ලි වෙන් කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා**
බෙරුවල රෝහල සම්බන්ධයෙන් අපි දැන් සද්ධ නැතිව ඉන්නවා. බේරුවල රෝහගේ වැඩ ආරම්භ කරන්න කියන්න.එදා සම්බන්ධිකරණ කමිටුවට මම යෝජනාවක් දැම්මා ඒ ගැන කතා කරේ නෑ.ඔබතුමාත් ඒ යෝජනාවල් මතක තියාගෙන සංවධර්න කමිටුවේදී ඉදිරිපත් කරන්න.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
අපි එහෙනම් ප්‍රාදෙශීය ලේකම්තුමාට ලිපියක් යවමු බේරුවල රෝහල සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න කියලා.

**ගරු මන්ත්‍රීනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය**
මජර්ාන් මන්ත්‍රීතුමාටයි පියල් මන්ත්‍රීතුමාටයි දැනුවත් කිරීමක් කරන්න .මොකද ඒ අයගෙනේ ආණ්ඩුව.ගරු රාජිත සේනාරත්න මැතිතුමා ඕක හදන්න ගත්තා.ඊට පස්සේ මේ අය ආණ්ඩු බලය ගත්තා.ඊට පස්සේ ඒක නැවැත්තුවා.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
සල්ලි පාස් උන ගානට කොන්ත්‍රාත් කට්ටිය වැඩේ කරා.ඊට පස්සේ සල්ලි ගෙවන්න කලින් ආණ්ඩු පෙරළුණා.

**ගරු මන්ත්‍රීනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය**
හරි දැන් අපේ ආණ්ඩුව පෙරලුනානේ.ඊට පස්සේ ආපු අළුත් ආණ්ඩුව දැනගන්න ඕන මේ රෝහලේ ඉදිරි වැඩ කටයුතු ටික කරන්න.

**ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා**
ඡන්දෙට මාස 06 ක් තියෙද්දි තමයි මේගොල්ලෝ ඒක පටන් ගත්තේ ඒකයි උනේ.

**ගරු මන්ත්‍රීනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය**
අපේ ආණ්ඩුව තිබුණානම්  මේ වෙනකොට මේක හදලා.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
අපේ සභාවේ තීන්දුවක් ගමු .අපි මජර්ාන් මන්ත්‍රීතුමාටත් කියමු පියල් මන්ත්‍රීතුමාටත් පිටපත් සහිතව  ලිපියක් යවමු.සම්බන්ධිකරණ කමිටුව .

**ගරු මන්ත්‍රීනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය**
ඔය ලක්ෂ 40 ගානෙ මන්ත්‍රීවරුන්ට දෙන වෙලාවේ ඒ සල්ලි වලින් ආණ්ඩුවට මේ වැඩ ටික කරන්න පුළුවන්.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
චීන කට්ටියක් එනවා ලංකාවට .ඒගොල්ලෝ ඇවිල්ලා අපේ භූමිය තුළ අපේ මැණික් අරන් යනවා කිසිම මුදලක් අපිට ගෙවන්නෙ නෑ.චීන කොටුවේ මැණික් වෙළදාම් කරන කට්ටිය කියනවා මේ එන කට්ටියගෙන් වාෂර්ිකව මුදලක් රුපියල් 6000 ක් හරි 10000.00 හරි අරගන්න.සභාවට ආදායමක් එනවානේ.

**ගරු මන්ත්‍රී -  එම්.එෆ්.එම්.හසන් මහතා**
හැම දෙනාම ටුවරිස්ලා කියලා තමයි එන්නේ.එහෙම ඔෆිස් එකකට එනවා කියලා ගානක් දෙන්නේ නැහැ.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
ටුවරිස් වගේ ආවට ඒ අයට රිසිට් එකක් කඩලා දෙනවා.

**<u>ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා</u>**
එතකොට ටුවරිස්ලා එන ඒරියා එකෙන්ම එනවා.ජෙම් ඇන්ඩ් ජුවලරි එකෙනුත් ගන්න වෙනවා.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
රට වටේම යන්න එපා. අපේ මේ බේරුවල පත්තකඩේ භූමිය තුළ වෙළදාම් කරන කට්ටියගෙන් ගන්න.අපේ සභාවෙන් අපි අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ගත්තා නම් ඒක හොඳයි.

**<u>ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා</u>**
එහෙම කරන්න එපා .නීතිමය පැත්තෙනුත් බලන්න.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
නීතිමය ගැටළුවක් නෑ. අතුරු ව්‍යවස්ථාවක් පනවා ගත්තාම පුළුවන්.
**<u>ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා</u>**
අතුරු ව්‍යවස්ථාවක් පනවා ගෙන ඒක එකතු කරන්න සභාපතිතුමාට බලය තියෙනවා.තවම ටුවරිස්ලා එන්නේ ටික දෙනයි. ඒ නිසා තව ටික කාලයක් ගිහින් මේ යෝජනාව ක්‍රියාත්මක කරමු.ඊට පස්සේ මේ නිසා ඒ මිනිස්සු යය තව රටවල් වලට .දැන් තමයි මිනිස්සු ටිකක් අපේ රටට එන්නේ.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
අපේ වගේ මැණික් වෙන රටවල් වල නැහැ.

**<u>ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා</u>**
අපේ ඉස්සර හිටපු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මැණික් ගේන කට්ටියට ලොකු සහනයක් දුන්නා.සීමාවක් නෑ. ඩොලර් 200 ක් ගෙවලා එන්න ලංකාවට එන්න පුළුවන්.කෝටි කීයක්ද කියලා එතුමාට අදාල නෑ.ඊට සප්සේ ඒකට නීතියක් දැම්මා. පස්සේ ලොකු ගල් ගෙනියන අයටත් පොඩි මැණික් ගල් ගෙනියන අයටත් ගනන් පෙන්නන්න බැරි උනා .එතකොට ගල් ටික බැංකොක් ගියා.මෙහේ පොඩි ගානක් ගෙවන කාලේ මෙහෙට කට්ටිය බහිනවා ගල් ටික අරගෙන .මෙහේ කට් ඇන්ඩ් පොලිෂ් කරලා ගන්නවා. එතකොට මෙහේ කට් ඇන්ඩ් පොලිෂ් කරන අයට රස්සාවයි වගේ රැකියා ඇති වෙනවා.ඒකෙන් ලංකාවේ ජනතාව ප්‍රයෝජනයක් ඇති වෙයි.ඊට පස්සේ කට්ටිය ගියේ බැංකොක් වලට.එහේ කට් ඇන්ඩ් පොලිෂ් වලට දුන්නා .ඒකෙන් අපේ ආර්ථිකයට බාධාවක් උනා.මැඩගස්කර් වල වෙළෙන්දෝ ටික එකතු වෙලා ජනාධිපතිතුමාත් එක්ක අගමැතිතුමිත් එක්ක සාකච්ඡා කරලා මෙහෙ ඉන්න මැති ඇමතිවරුත් එක්ක කතා කරලා වට්ස්අප් වලින් බොහොම අමාරුවෙන් තමයි මේක මේ තත්ත්වයට ගෙනාවේ.ලංකාව වැටිලා ඉන්න අවස්ථාවේ මගේ යෝජනාව මේක ටිකක් පරක්කු කරලා ගන්න. මම සභාපතිතුමා ගන්න ඕනම තීරණයකට එකඟ වෙනවා.මගේ තියෙන දැනුමෙන් මම කියන්නේ.මොකද දැන් තමයි ටුවරිස්ලා එන්නේ. ඒ අයට එන්න ඉඩදෙන්න.

**<u>ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා</u>**
ගරු සභාපතිතුමා මට දැන් මතක් උනේ අපේ ස්පෝටින් ටයිම්ස් එකක් තිබිලා දැන් දෙකක් වෙලා. ඒකට අපි තීරණයක් ගත්තා ඒවා වහනවා කියලා.ඒකට අපි සභාවෙන් තීන්දුවකුත් ගත්තා.ඒත් ඒකට කිසිම දෙයක් වෙලා නෑ.ඒගොල්ගොල්ලෝ කියනවා ඉහලින් නියෝගයක් ඇවිල්ලා නෑ කියලා.එහෙනම් උසාවි ගිහින් මේක නවත්තන්න ඕනනේ.

**<u>ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා</u>**
මුළු ලංකාවටම බලපාන බලපත්‍රයක් මේ අය අරගෙන තියෙනවද?

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
ලංකාවටම බලපාන විදිහට ගත්තට කමක් නෑ .අපෙනුත් අවසර ගන්න ඕන.

**<u>ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා</u>**

එහෙම ගන්න පුළුවන් උනත් සභාපතිට බලය තියෙනවා ඒක නවත්තන්න.නගර සභා සීමාවේ.එහෙම තියෙනවානේ සභාපතිතුමා.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**

ඒක ගැන බලන්න ලේකම් මහත්තයා.ලංකාවටම බලපාන විදිහට ගත්තත් අපෙන් අවසර ගන්න ඕන.සමහර සම්බහාන මධ්‍යස්ථාන තියෙනවා ලංකාවටම බලපාන විදිහට අවසර අරගෙන තියෙන්නේ.ඒත් ඒවා කරන්නේ කොළඹ විතරයි.මෙහේ කරන්න බෑ. මෙහේ කරනවා නම් අපෙන් අවසරය ගන්න ඕන.

**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**

වහාම ඒකට මැදිහත් වෙලා අවශ්‍ය පියවර ගන්න.ආයෙත් කියන්න එපා ඉහලින් නියෝග නෑ කියලා.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**

නැවත කියන්න තියන්න එපා.ආර් අයි මහත්තයා ඒක නවත්තන්න අවශ්‍ය පියවර ගන්න.මුහුදු ගිහින් ඇවිත් මිනිස්සු ඔක්කොම යන්නේ එතන්ටයි.

**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**

මම ඊළඟ සභාවෙදී අහනවා මේකට මොකද උනේ කියලා.

**ගරු මන්ත්‍රී - එම්.එෆ්.එම්.හසන් මහතා**

අපි මෙහේ කතා වෙනවා .ආයෙත් ඒක වැඩක් නැතිව යනවා.කිසිම ඇක්ෂන් එකක් ගන්නේ නෑ.මේවට මොකද වෙන්නේ කියලා හොයලා බලන්න ඕන.නිලධාරීන්ට මොකක් හරි බලපෑමක් ඒ ආයතන වලින් තියෙනවද කියලා.ගැටළුවක් ඒක. සභාපතිතුමා නියෝග දීලත් ක්‍රියාත්මක නොවෙන නිසා.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**

ආර් අයි මහත්තයාටයි,ලේකම් මහත්තයාටයි මේක භාර.ඒක ගැන හොයලා බලලා ක්‍රියාත්මක කරන්න.
මජරාන් මහත්තයගේ ප්‍රතිපාදන මත ප්‍රතිපාදන ටිකක් පාස්වෙලා තියෙනවා.පාරවල් ටිකක් කාපට් කරන්න. පරන පාර,අතුරපාර,කෝපියාවත්ත පාර,හසන් මන්ත්‍රිතුමාගේ සෙයින් මාවත,රාසික් මරික්කාර් මාවත,නගරාධිපති මාවත,රවුෆ් මාවත,බයි රෝඩ් ඕල්ඩ් රෝඩ් දක්වා.සිරිනිවාස පාර.මේ ටිකට මුදල් අනුමත වෙලා තියෙන ලිපිය ඇවිල්ලා.තව පාරවල් ටිකක් තියෙනවා ඒ ටික ආවම කියන්නම්.

**ගරු මන්ත්‍රී - එම්.එෆ්.එම්.හසන් මහතා**

හලවාගොඩ පාර ,ගොඩැල්ල පාර (රණවිරුමාවත) ඒකත් කරන්න ඕන.

**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**

නවුෆරු මාවත ගොඩක් අබලන් වෙලා.ඒක හදලා දෙන්න සභාපතිතුමා.ඒක කාපට් කරලා වාහන ගන්න බෑ.

**ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා**

කාපට් කරන මැෂින් එක ඒ පාරට දාන්න බැහැ.මම ගමේ මිනිස්සුන් එක්කත් කතා කළා.සමහර තැන් වලින් පාරට දෙන්න වෙනවා කියලා .වංගු වලට හරි කාණු වලින් හරි පාරට දෙන්න කියලා ඒ අයත් එක්ක කතා කරන්න

**ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා**

දැන් පාරවල් අනුමත වෙලා තියෙනවා.ඒ පාරවල් වලින් යන්න බෑ කාපට් එක දාන්න.ගෙයක් හදනකොට නගර සභාවෙන්නේ අනුමැතිය දෙන්නෙ. නගර සභාව අනුමැතිය දෙනකොට බලන්න ඕන තාප්පයක් බඳිනවා නම් වැරදි විදිහට ඒක නවත්තන්න. ඒක තමයි ප්‍රශ්න වෙන්නෙ.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**

දැන් අපිට ආණ්ඩුකාරතුමා කියලා තියෙන්නේ අඩි 3 ක් ඇරලා අනුමැතිය දෙන්න කියලා.කොන්ක්‍රිට් කණු,ලයිට් කණු, ටෙලිෆෝන් කණු ,කාණු එනවා.මේ තුනටම ඉඩ තියලා තමයි තාප්පේ හදන්න ඕන.

**ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා**

දැන් මජර්ාන් මන්ත්‍රීතුමා ප්‍රතිපාදන දීපු සභාපතිතුමා කියපු පාරවල් වලට මේ ගැටළුව නැහැ.ඉදිරියට තියෙන ඒවා ගැන අපි හොයලා බලමු.

__ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා__
නවුෆර් මාවත අපි ගිහිල්ලා නිරීක්ෂණය කරලා කඩලා ගමු.එස් ඩබ්ලිව් මහත්තයා නවුෆර් මාවත ගිහිල්ලා බලලා නිරීක්ෂණය කරලා හදමු.නැත්නම් අපරාදේ ඒ සල්ලි ටික.

__ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා__
නවුෆර් මාවතේ තියෙන ප්‍රශ්නය වත්තෙන් තමයි එගොල්ලෝ පාර දුන්නේ.පාර ඒ අය අල්ලලා නෑ. පාරට දුන්නේ ඒගොල්ලෝ .එතකන් පැව් කරලා දෙන්න.

__ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය__
නගරාධිපතිතුමා ,වීදි ලාම්පු වලට තවම විසඳුමක් නෑ.

__ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා__
ගාලු පාරේ විදී ලාම්පු ඔක්කොම දැම්මානේ.
__ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය__
මේ අතුරු මාගර් වල කොයි තරම් තියනවාද

__ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා__
අපිට තවම ලෙකෝ එකෙන් දුන්නේ නැහැනේ.

__ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය__
ඔබතුමා කතා කරලා ඉල්ල ගන්න ඕනනේ.අපි කතා කරනවා තවම විසඳුමක් නෑ.

__ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා__
ඒ ප්‍රදේශ වල ඉන්න අයගෙන් සල්ලි එකතු කරලා තමයි අපි ලයිට් දාන්නේ.

__ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා__
අපි සම්මත කරගමු පියල් නිශාන්ත ඇමතිතුමාටයි,විදුලිය භාර ඇමතිතුමාටයි ,මජර්ාන් මැතිතුමාටත් දීලා විදී ලාම්පු නගර සභාවට නඩත්තු කරන්න අපිට පවරලා දෙන්න කියලා.

__ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා__
ගරු සභාපතිතුමා අපේ නගර සභා සීමාව ඇතුලේ තියෙන්නේ කොට්ඨස 09 යි.ඒවා අපිට නිරීක්ෂණය කරන්න පුළුවන් .කිලෝමීටර් 5 ක් 06 ක් ඇතුලේනේ මේක තියෙන්නේ.නගර සභාවේ සීමාවේ මැප් එක ගත්තාම අපිට ඒක නිරීක්ෂණය කරන්න පුළුවන්.අපි සභාවෙන් තීරණයක් ගමු මේ පාරවල් කවුද අල්ලගෙන ඉන්නේ කියලා නිරීක්ෂණය කරන්න.කාලෙකදී අපේ දරුවන්ට මුඩුක්කු පාරකින් තමයි යන්න වෙන්නේ.

__ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා__
ඊයෙ පෙරේදා කවුද එක්කෙනෙක් අල්ලගෙන තියෙන්නේ ලෙල්ලම ඉස්සරහ.වැට ගහලා.

__ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා__
සභාපතිතුමා සමහර කට්ටිය තාප්ප බැඳලා පාර අල්ලගෙන ඉන්නවා.ඒකට මම කියන්නෙ නගර සභාවෙන් නිරීක්ෂණයක් කරන්න කොතන ද අල්ලන් ඉන්නේ කියලා.මම කියන්නේ ඔබතුමා රාසික් මරික්කාර් මහත්තයාගේ ආදශර්ය ගන්න කියලා.මම කියන්නේ ඔබතුමා වගකීමක් දරන පුද්ගයෙක් මේ නගර සභාවේ.ඔබතුමා හතරවෙනි පාරට මෙතන නගරාධිපති වෙලා තියෙන්නේ.ඡන්ද එයි .නැතිවෙයි.
මගෙත් මාමා ඔබතුමාගෙත් මාමා රාසික් මරික්කාර් මහත්තයා.ඔය පුටුවේ වාඩිවෙලා හිටියානේ. එයා අවුරුදු හතරක් පාලනය කළා.අපි නගරාධිපතිතුමාට කියන්නේ ඒගොල්ලෝ කරපුවා බලන්න කියලා.
අපේ දරුවන්ට මුඩුක්කු පාරවල් වලින් යන්න ඉඩ තියන්න එපා. ඔබතුමාට මේක කරන්න ශක්තියක් තියෙනවා.

__ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා__

මම නගර සභාවෙන් පාරවල් පළල් කරගෙන යනකොට මගේ කකුලෙන් අදින්න එපා . ඔබ්ජෙක්ෂන් දාන්න එපා.අපේ අසල් වැසියේ අපේ ඥාතීන් කියලා කියන්න එපා.

ගරු මන්ත්‍රිනී - එම්.ජේ.එච්.ඒ.පද්මකාන්ති මිය
ගරු සභාපතිතුමා ,බංගලාවත්ත පාර අල්ලගෙන තාප්ප හදපු එක නඩු යනවා දැන්.ඒ අය මාව හම්බෙන හැම පාරම කියනවා මෙහෙමයි කියලා.

ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා
අපි ගියානේ. තාප්ප අල්ලලා.නිසා ඇළ මාගර්ය පළල් කරන්නත් බෑ.අඩි 10 යේ ඇළ මාගර්ය අඩි 02 කරලා.කොහොමද ඉතින් සුද්ධ කරන්නේ.

ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය
ඒකට නගර සභාව තමයි වග කියන්න ඕන.

ගරු මන්ත්‍රිනී - එම්.ජේ.එච්.ඒ.පද්මකාන්ති මිය
පළතුරු කඩේ ඒගොල්ලෝ පාරේ හරියටම දෙපැත්තම අල්ලලා.වාහනයක් ගන්න බෑ.
ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය
ඒ ඇළ මාගර්ය අල්ලලා එක්කෝ ටොයිලට් එකක් හදලා,එක්කෝ බාත්රූම් එකක් හදලා.එක්කෝ කුස්තියත් හදලා. ඉතින් වතුර බහින්නේ කොහොමද.ඇයි නගර සභාවෙන් අනුමැතිය දෙන්නේ.මංගල පාරෙත් ප්‍රශ්නයක් තියෙනවා.

ගරු මන්ත්‍රිනී - එම්.ජේ.එච්.ඒ.පද්මකාන්ති මිය
ඔය තාප්ප ප්‍රශ්නය තමයි හැම තැනම තියෙන්නේ.ඉඩම අයිනෙන්ම තාප්පේ බඳිනවා.ඒකට මොකක් හරි විසඳුමක් දෙන්න ඕන.

ගරු මන්ත්‍රිනී - එම්.එච්.ෆාතිමා රිනූසා මිය
අපි දන්නේ නෑ හෙට මොනවද වෙන්නේ කියලා.එක්කෙනෙක් හිටියලු .එයා රටවල් අල්ලගෙන ආවලු. අන්තිමට එයා මැරෙන වෙලාව ඇවිත් .ඇලෙක්සැන්ඩර් ගැන කියන්නේ.එයා කිව්වාලු එයාගේ ඩෙක්ටසර්ලට කිව්වලු මිනී පෙට්ටිය උස්සන් යන්න කියලා.අනිත් එක කිව්වලු එයා අත් දෙකම මිනී පෙට්ටියෙන් එළියට දාන්න කිව්වලු .අනිත් එක කිව්වලු එයා හම්බකරපු දේවල් ඔක්කොම පාරේ දාලා ගෙනියන්න කියලා.ඒ කියන්නේ යනකොට අපි හිස් අතින් තමයි යන්නේ.අනිත් එක කිසිම ඩොක්ටර් කොනකුට අපිව බේරන්න බෑ.ඒ නිසා අපි දැන් පාරවල් ගැන කතා කළනේ.මුලින්ම අපි දැන ගන්න ඕන අපේ මිනී පෙට්ටිය කොහොමද ගෙනියන්නේ කියලා.මම දැක්කා මොල්ලියමලෙ අපි යනකොට ඒ පා හරිම පටුයි.මට ඒ වෙලාවේ හිතුනා .කවරුවත් එතන ගිහින් බලන්නේ නැත්ද කියලා.ලඟදී මැරුනේ සලාහුදීන් .ඒ අයගේ ගෙවල් ලඟින් යන පාර.ඒ පාරේ මිනි පෙට්ටියක්වත් ගෙනියන්න බැහැ.ඒවා බලන්න ඕන.

ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා
ගරු සභාපතිතුමා, අපිට ඉතිහාසයෙන් ඉගෙන ගන්න පාඩම් තියෙනවා.අපේ තාත්තා කියපු කතාවක් මේක.එෆ් ආර් ප්‍රනාන්දු මහත්තයාත් මේ පුටුවේ ඉන්න උපනගරාධිපතිතුමාගේ ගෙදරටත් එන්නේ එකම පාරේ.එෆ් ආර් ප්‍රනාන්දු මහත්තයාට කියන්නේ නැතිව එයා මරික්කාර් පදෙසේ හනෆි මහත්තයාගේ ගෙදරට එන බෝක්කුව කැඩුවා.ඒ බෝක්කුව ටිකක් හරස් වෙලාලු එන්න ඕන.එතකොට නගරාධිපති එෆ් ආර් ප්‍රනාන්දු මහත්තයා. උපනගරාධිපති මෙතුමාගේ බාප්පා.එයා නගරාධිපතිතුමාගෙනුත් අනුමැතියක් අරගෙන්නේ නැතිව ඒ වැඩේ කරලා.නගර සභාවෙන් තීන්දුවක් ගත්තාලු ඒ කාලේ ඒකට වියදම් උන මුදල අයකරන්න කියලා.උපනගරාධිපතිතුමාගෙන්.

ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා
උප නගරාධිපතුතුමාගේ නම මොකක්ද?

ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා
සමඩ් මහත්තයා.නගර සභාවේ නගරාධිපතිතුමාට ඒ වගේ තීන්දුවක් ගත්තේ.නැවත ඡන්දයක් ඇවිල්ලා ඔබතුමාවම පත් කරයි .අවංකවම ඒ ගැන බලාගෙන ඉන්න මිනිස්සු .ඒගොල්ලෝ තමයි වැඩි.එළුවෝ ප්‍රශ්නයක් තිබුණානේ.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
මගේ ගෙට්ටුවෙන් වත්තට ඇතුල්වෙලා ඔක්කොම මල් ගස් ටික කාලා ගිහිල්ලා.

**ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා**
ඒකට ඔබතුමා හරියට තීන්දුවක් ගත්තොත් ඔබතුමාට ගස් ටික බේර ගන්න පුළුවන්.ඒකට තීරණයක් අරන් පාරේ ඉන්න එළුවෝ ටික නගර සභාවට ගත්තා.ඊට පස්සේ ඒ අයට දඩ ගහන්න ගත්තානම් හරි.
අපි ඩොලර් කන්දක් උඩ ඉඳගෙන ඩොලර් හොයනවා.පිහිටීම අතින් හොඳම පිහිටීම තියෙන රට. මැණික් තියෙනවා. මිනීරන් තියෙනවා.කියන්න බැරි තරමට සම්පත් තියෙනවා.
මේ රටේ තුන්වෙනි බලවේගය විදිහට ජාතික බලවේගයට බලයක් දෙන්න මිනිස්සු දැන් ලෑස්ති වෙලා ඉන්නේ.ඒ ගැන මිනිස්සු කතා කරන කාලේ ඇවිල්ලා .ඒ මිනිස්සු දැන් කල්පනා කරනවා අපිට රටක් ඕන කියන සමාජයක් දැන් බිහි වෙලා තියෙන්නේ.මිනිස්සුන්ට තියෙන්නේ ආර්ථික ප්‍රශ්න. අපි නැගිට්ට කොට පෙට්‍රල් වැඩි වෙලා.මිනිස්සු ඉතාමත් බරපතල දුකක් එක්ක ජීවත් වෙන්නේ.දරුවො දෙතුන් දෙනා ඉන්න තැන්වල ජීවන වියදමත් එක්ක මිනිස්සු කොහොමද ජීවත් වෙන්නේ.අපි ඡන්දය බලාගෙන වැඩ කරලා වැඩක් නැහැ.ඔබතුමාට මේක දෙයියෝ දීපු වරමක් තියෙනවා.හතර වතාවක් ඔබතුමා මේකේ නගරාධිපති ඔබතුමාටත් මේකේ වගකීමක් තියෙනවා.සමහර අය අකමැතිය තමයි.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
මේ නගර සභා සීමාව තුළ ඉඳගෙන හැම දේම කරන්න බැහැ මන්ත්‍රිතුමා .මිනිස්සු අමනාප වෙනවා.

**ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා**
සමහර මිනිස්සු අකමැති වෙනවා තමයි. ඒත් කරන්න වෙනවා.අපේ දරුවෙක් අපි එකළුක්කෙනා කියන විදිහට කසාද බන්දලා දෙන්නේ නැහැනේ සභාපතිතුමා.අපිට හරියටම කැමති කෙනාට තමයි අපි දෙන්නේ.ඔබතුමාට වගකීමක් තියෙනවා. ඒක ලොකු පිනක්.

**ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා**
ගරු සභාපතිතුමනි. අපේ මංගලාරාම විහාරයේ තියෙනවා ලොකු පිං කමක්.10 වෙනිදට තියෙනවා ලොකු ශ්‍රමදානයක්.පන්සලේ කුණු කසල ටික ශුද්ධ කරලා නගර සභා සේවකයෝ ටිකක් යවලා ඒ ටික කරගන්න ඕන.නගර සභාවට ලිපියක් දුන්නා.
ඒ වගේම ඔබ දෙපළම කතා කළා බණ්ඩාරවත්තේ ගිහාන් මහත්මයාගේ කඩේ ප්‍රශ්නය ගැන.ඒකට ඔබතුමාව මුණගැහෙන්න කියපු නිසා ඒක නැවැත්තුවා.එයාට එක්ලක්ෂ අසූ නව දාහක් ගෙවන්න තියෙනවලු.ඒක වාරික තුනකින් ගෙවන්න අවසර ඉල්ලා තියෙනවා.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
ලියුම තියෙනවා මගේ ළඟ. බලමු.

**ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා**
එයා ඉල්ලා සිටින්නේ සල්ලි ගත්තට දොරවල් ජනෙල් හදලා දෙන්න කියලා .ඒවා හරියට සකස් කරලා දෙන්නේ නැලු මේ සල්ලි අය කරාට .දොරවල් ජනෙල් හොඳ නැහැලු.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
ලේකම්තුමා මේ සල්ලි ටික යොදවලා ඒගොල්ලන්ගේ රෙපෙයාර් ටික කරලා දෙන්න පුළුවන්නෙ.
ඒ වගේම ප්‍රාදේශීය ලේකම් කායර්ාලයේ දැනුම් දුන්න අර කොට්ඨාසය දිනපු මන්ත්‍රිවරයෙකුට ලක්ෂ 40 ක් දෙනවා කියලා කියපු ව්‍යාපෘති.කොටි 40 දාහක් පාස් වෙලා තියෙනවා. ඒ සල්ලි තවම නෑ. ඒ සල්ලි ලැබෙනවා.ඒ කෝටි හතලිස්දාහ ප්‍රමාද උනේ ඒ සඳහා ව්‍යාපෘති වලට ලක්ෂ 40 ටම මම යෝජනා කළා බෝක්කු දෙකක්.දවස් දෙකකට පස්සේ එතනින් කිව්වා ලක්ෂ 16 ක් දාන්න අනිත් ටික දාන්න කිව්වා ස්වයං රැකියා වලට .ස්වයං රැකියා වලට දාන්න මේ නගර සභාවට ඇවිත් බොහොම අමාරුවෙන් මිස්ලා දෙන්නෙක් අල්ලගෙන මේකේ ගනන් හදාගෙන්නත් අමාරුයි. මොනවද දෙන්නේ කියලා හිතාගන්නත් බැහැ.පරණකඩේටම දැම්මා බයිසිකල්.පොල්කොටුවටම දැම්මා මැෂින්.ඉලෙකක්ට්‍රොනික් තරාදි දැම්මා.නමුත් මේක කරන්න තිබුනේ මෙහෙම නෙවෙයි.කොට්ඨාසයේ හැම තැනටම බලලා දෙන්න මැසින් වගේ දෙන්න. නමුත් ඒක කරගන්න බැරි උනා.ප්‍රාදේශීය ලේ කම්කායර්ාලයේ රැස්වීමක් තිබිලා තියෙනවා.ඒ රැස්වීමට අපිට ආරාධනා කළේ නෑ.ඒ රැස්වීමට නගරාධිපතිතුමාට විතරයි එන්න කියලා තිබුනේ.එදා ප්‍රාදේශීය ලේකම්තුමා

කියලා තියෙනවා මේක සංශෝධනය කරන්න කියලා.නමුත් අපි දැනගන්නකොට ප්‍රමාදයි.දැන් ඉතින් මේක අපිට හරි අමාරු ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ.සල්ලි ආවත් අපි මේ ලැයිස්තුව හරි ගස්සලා තියෙන්න ඕනනේ. ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.අපිට මේවා නැවත් සකස් කරන්න වෙනවා. මැෂින් දෙන්නේ කාටද,බයිසිකල් දෙන්නේ කාටද කියලා.

<u>ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා</u>
ඩෙංගු රෝගය දැන් හැම තැනම පැතිරිලා තියෙනවා.මටත් ඩෙංගු හැදිලා දවස් 10 ක් විතර ගෙදරට වෙලා හිටියා.ඒකට විසඳුමක් ගන්න වෙනවා. බෙහෙත් හරි ගහන්න.තවම මට ඇඟට සනීපයක් නැහැ.අනිත් අය ගැනවත් හිතලා බෙහෙත් ගැහුවෙත් හොඳයි කියලා මම හිතනවා.

<u>ගරු මන්ත්‍රී - එම්.එෆ්.එම්.හසන් මහතා</u>
සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමා,මුලින්ම අපේ කනගාටුව ප්‍රකාශ කරන්න ඕන.අපේ පියල් මන්ත්‍රීතුමත්,මජරින් මන්ත්‍රීතුමත් ඔක්කොම ඇවිල්ලා නගර සභා මන්ත්‍රීවරු වශයෙන් අපිටත් එන්න කියලා .අපිත් පක්ෂ භේද බලන්නේ නැතිව ජනතාවට සේවයක් වෙන නිසා අපිත් ආවා මෙහෙට.ලක්ෂ 40 ව්‍යාපෘති ලබා ගන්න.අපිට කිව්වවේ පාරවල් ,කාණු වගේ දේවල් හදන්න ලක්ෂ 40 ක් දෙනවා කියලා.අමතර සල්ලි දෙනවා කිව්වා ස්වයං රැකියා කරන එකට ලක්ෂ 30 ක් .දැන් ඒක ලක්ෂ 70 වගේ අතුරුදහන් වෙලා .මේ ලක්ෂ 40 ත් ලක්ෂ 16 ක් පාරවල් වලටත් ලක්ෂ 24 ක් ස්වයං රැකියා වලටත් දාන්න කියලා.අපිටත් ඒකට වෙලාවක් දෙන්න ඕන කොහොමද ඒක කරන්න ඕන කියලා සැළසුම් කරගන්න.අපේ ඇක්ලන්ඩ් මන්ත්‍රීතුමා කියපු විදිහට .මේ වගේ වැඩ වලින් මන්ත්‍රීවරු අප්‍රසාදයට පත් කරන්න එපා කියලා අපේ කණගාටුව ප්‍රකාශ කරනවා.

මේක පෞද්ගලිකව මට දෙනවා නම් මම එපා කියලා කියනවා.ජනතාවටනේ දෙන්නේ. අපේ පක්ෂය හැටියට අපිටත් ආත්ම ගෞරවයක් තියෙනවා.මෙතනට ඇවිල්ලා එයාගේ අතින් අපිට ගන්න උවමනාවක් නෑ. නමුත්

ජනතාව වෙනුවෙන් අපි ඒකත් කරනවා.ඕනම දෙයක් ජනතාව වෙනුවෙන් කරනවා නම් අපේ දේවල් පැත්තකින් තියලා අපි යනවා.එක දෙයක් කියලා අපිව නොමග යවන්න එපා.
දැන ජනතාවට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් උදා වෙලා තියෙන්නේ.ජනතාවගේ ආථර්ික මට්ටම බින්දුවට වැටිලා.බඩු මිළ අහස උසට නැගලා.ජීවත් වෙන් බැරි අංක එකේ රටක් වෙලා දැන් තියෙන්නේ.ජනතාව ඔක්කොම රට දාලා යන්න බලාගෙන ඉන්නේ. ඒකත් බැරිව තමයි ඉන්නේ.ජනතාවට මුහුදට තමයි පනින්න තියෙන්නේ.

<u>ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා</u>
ඔස්ට්‍රේලියාවේ තහනම අයින් කළා.

<u>ගරු මන්ත්‍රී - එම්.එෆ්.එම්.හසන් මහතා</u>
යන්න පුළුවන් එහෙට .ඒත් යන්න බැරිව ඉන්නේ.ලංකාවෙන් යන්න දෙන්නේ නැහැ. මුහුදෙන් තමයි යන්න තියෙන්නේ.මිනිස්සු ඒ තරම් අමාරුවකින් ඉන්නේ.මම කාරුණිකව රජයෙන් ඉල්ලා සිටිනවා.මේක කරන්න පුළුවන් අයට භාර දීලා යන්න කියලා.

<u>ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා</u>
ගරු සභාපතිතුමනි.ලේකම්තුමනි,නිලධාරි මණ්ඩලයෙන් හා පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි.බුහාරි පල්ලියේ උත්සවය ලඟ එනවා.අපේ සභාවෙන් පන්සල් ,පල්ලි ,කතෝලික පල්ලි වලට වගේ පොදු ස්ථාන වල හැම උත්සවයටම අපි සභාවෙන් උදව් කරනවා.ඒ කට අවශ්‍ය වැඩ කටයුතු කරලා දෙනවා.බුහාරි පල්ලියෙ වැඩ කටයුතු වලට අපි මුල් තැන් දීලා වැඩ කරනවා.ඒ පැත්තේ පාරවල වලට පැච් දාලා කාණු පද්ධති සුද්ධ කරලා දෙන්න කියලා මම සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.
පහුගිය දවස්වල පත්තකඩෙූ ආශ්‍රිතව පාරක් කාපට් දැම්මා ශේහුනප්පපා මාවත.එතන පාරක් කඩලා තියෙනවා සියාන් මන්ත්‍රීතුමා.හාරිස් හජ්ජියාරගේ ගෙදරය යන පාරේ පල්ලෙහාට.ඒක ටිකක් බලන්න ඕන.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
ඒ අයට ලිපියක් යවන්න අලාභය ගෙවන්න කියලා.

<u>ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා</u>
ඒ වගේම ගරු සභාපතිතුමා ලයිට් ප්‍රශ්න තියෙනවා.මන්ත්‍රීවරු ලයිට් ඉල්ලනවා. අපිට සභාවෙන් ලයිට් දීලා නෑ.බලයට ආපු කාලේ අපේ පක්ෂයට උදව් කරන ව්‍යාපාරිකයෝ ඉන්න කට්ටිය උදව් කරලා ලක්ෂ ගානක

ලයිට් දාලා ඒ ප්‍රශ්නය අපි විසඳගත්තා.අපේ සභාපතිතුමා මැදිහත් වෙලා.ඒ වගේම අද වෙකොට ඒ ලයිට් ටික පිච්චිලා අපි නැවත මුදල් එකත් කරලා ඒ ලයිට් දැම්මා. ලෙකෝ එකෙන් ඒත් මුදල් දුන්නේ නැහැ.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
ගාලු පාරට විතරක් දැම්මා.

<u>ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා</u>
අතුරු මාගර් වලට ලයිට් මම දන්න විදිහට දුන්නේ නෑ. අපි ලෙකෝ එකෙන් ඉල්ලීමක් කරමු ලයිට් දෙන්න කියලා.කොළු හරි ලයිට් එක්ක පත්තු වෙන්නේ නැතිනම් මගේ අතිනුත් ගානක් දාලා තව කවුරු හරි හොයාගෙන ගන්නවා.ගොඩක් මන්ත්‍රිවරු එහෙම තමයි කරගෙන යන්නේ.ඉදිරියට සභාවෙන් මේකට හොඳ විසඳුමක් එයි.
හසන් මන්ත්‍රිතුමා කිව්වා කෝටි 70 ව නැවෙන් එනවද කියලා.සභාපතිතුමා එතුමා වගේම මේ සභාවේ කිව්වා ඒ කෝටි 70 ට වුන දේ ගැන . ඒක කවුද අපිට දෙන්නේ,මොන ආයතනයෙන්ද දෙන්නේ,සියළුම දේවල් විස්තර කරලා දුන්නා.ඒ ව්‍යාපෘති වලට ලංකාවේ ඉන්න නිලධාරි වරු ඇස්තමේන්තු හදලා අපිට දුන්නා.සභාපතිතුමා ඒ වැඩ ටික පටන් ගත්තා.අපිට එක එක ව්‍යාපෘති ගැන ප්‍රොජෙක්ටරයට දාලා පැහැදිලි කරා.ඒක බොරුවක් නෙවෙයි කරේ. ඒ සල්ලි එන්න තිබුණා.අපි විතරක් නෙවෙයි. තවත් සභාවල් ගනනාවකටම සල්ලි අනුමත වෙලා තිබුනේ.ඒක තමයි ඡන්ද කාලේ මජරාන් මහත්තයාත් කිව්වේ.ඒක දෙන මාගර්ය දැනගෙන තමයි එතුමා

කිව්වේ. එතුමා අතින් දෙනවා කියලා කිව්වේ නැහැ.ඒ කතාව තියාගෙන ඡන්ද කාලේ එතුමාට මඩ ගැහුවා.එහෙම බොරුවක් වංචාවක් කරන කෙනෙක් නෙවෙයි මජරාන් මහත්තයා.ජනතාව රවට්ටලා ඡන්දෙට

එන කෙනෙක් නෙවෙයි එතුමා.එතුමා රජයේ දෙන පඩියත් ගන්නේ නැතුව,රජයෙන් දෙන වාහනයවත් පාවිච්චි කරන්නේ නැහැ.එතුමාගේ රියදුරන්ට පවා පාලරීමේන්තුවෙන් කෑම කන්න නොදී පිටත් කන්න අරන් දෙන කෙනෙක් .එතන ඉන්න නිලධාරින් අපිට කියනවා මෙතුමා පුදුම කෙනෙක් කියලා.

ඒ වගේම රජයේ නියෝජිතයෙක් විදහට පිටරටකට ගියත් එතුමාගේ වියදමින් සම්පූණර්යෙන්ම ටිකට් පවා අරගෙන යන කෙනෙක්.ගමේ මිනිස්සුන්ටත් එතුමාගේ වියදමින් දෙයක් කරන කෙනෙක් එතුමා. කියන්න කනගාටුයි ඡන්ද කාලෙදී එතුමාගේ වොයිස් කට් එකක් දාලා එතුමාට මඩ ගහන්න කට්ටිය ලෑස්ති වෙනවා.ජාතිවාදි ප්‍රශ්න ආපු වෙලාවල් වල එතුමා ඒ පක්ෂයේ ඉදගෙන තමයි ජනතාවට උදව් කරන්නේ.දිගින් දිගටම එතුමාට පහර ගහන එක මම හෙලා දකිනවා.
ලක්ෂ හතලිහ ගැන හසන් මන්ත්‍රිතුමා කතා කළා.මේක අද ඊයේ ආණ්ඩුවෙන් යෝජනා කරපු දෙයක් නෙවෙයි.මාස 06 කට කලින් ඉඳලා ඉහල මට්ටමේ නිලධාරින් සමඟ සාකච්ඡා කරලා පියල් නිශාන්ත මන්ත්‍රිතුමායි,මජරාන් ෆලීල් මන්ත්‍රිතුමයි ඇවිල්ලා පක්ෂ විපක්ෂ මන්ත්‍රිවරු ආවා. ලංකාවේ පළවෙනි වතාවට පක්ෂ විපක්ෂ මන්ත්‍රිවරුන්ට ලක්ෂ 40 ක් දෙනවා කියලා ඒ අදාල ලිපි ගොනුව මෙහෙදි මන්ත්‍රිවරුන්ට භාර දුන්නා.කැමති අය ඇවිත් භාර ගත්තා.ඒක දෙන්න තීරණය වෙලා තියෙන කොට පාලරීමේන්තුව ඇතුලේ තියෙනවානේ මන්ත්‍රිවරුන්ගෙ සාකච්ඡා මණ්ඩලයක් ,එතනදි කතාවෙලා මාස 06 ක් යනකොට අපේ ලංකාවේ කන්න බොන්න බැරි තත්ත්වයක ඉන්න දුප්පත් ජනතාව ඉන්නවානේ.පාරවල් හදනවට වඩා ආථර්ික මට්ටමින් පහළ තත්ත්වයක ඉන්න ස්වයං රැකියා කරන අයගේ ආථර්ික මට්ටම ශක්තිමත් කරලා දෙමු කියලා සාකච්ඡා වෙලා තීන්දුවක් ගත්තා.ඒ වගේ සුළු ව්‍යාපාර දියුණු කරන්න ඕන කියලා තමයි මේක වෙනස් කරේ.ආන්ඩුවට මේක කාණුහදලා හරි ජනතාවට දීලා හරි යන්න පුළුවන්. නැවත කල්පනා කරලා තමයි නිලධාරින් මන්ත්‍රිවරුන් කියපු යෝජනාව ජනාධිපතිතුමා පිලිගත්තා.ඒක නිසා තමයි වෙනස් කරේ. ඒකටත් මඩ ගහනවා.
අද සභාවේ කටයුතු හොඳට සිදු උනා ස්තුතිය මගේ කතාව අවසන් කරනවා.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>

අද අපි සභාවේ විශේෂ තීන්දුවක් ගත්තා .අපේ නගර සභාවට කෝටි ගානක් වටිනා වස්තුවක්. ඒ සම්බන්ධ ලියකියවිලි සියළු දේ ගිනිබත් වෙලා විනාශ වෙලා ගිය නිසා අපිට ඔප්පු සොයාගත නොහැකි වූ බේරුවල වෙරළ ක්‍රීඩාංගනයට අපි අවුරුදු 10 කට පෙර ප්‍රකාශන ඔප්පුවක් ලිව්වා .ඒ ප්‍රකාශන ඔප්පුව අපි ළඟ තියෙන කොට යූඩීඒ එකට සංවධර්න කටයුතු කරන්න බෑ කියලා ඔවුන් කියලා තිබුණා.ඒ නිසා අපි ඒ ප්‍රකාශන ඔප්පුව නිෂ්ප්‍රභා කරන්නට ඕන.එහෙම කරලා ඒ අයට දැනුම් දෙන්න ඕන .ඊට පස්සේ ඒ අය කෝටි අටක්ද 10 ක ප්‍රමාණයක් වියදම් කරලා සංවධර්නය කරලා නැවත අපේ සභාවට භාර දෙනවා.ඊට පස්සේ අපේ සභාවෙන් තමයි ආදායම් මාගර් උත්පාදනය කරන්න ඕන.

ඒ වගේම අපිට තියෙන එකම එක සුසාන භූමිය පිටවල සුසාන භූමිය .අවුරුදු 70 ක් පමණ කාලයක් පරිහරණය කරන සුසාන භූමිය සම්බන්ධයෙන් බේරුවල සම්බන්ධිකරණ කමිටුවට යෝජනාවක් ඇවිත් තිබුණා ප්‍රාදේශිය සභාවේ මේනක සභාපතිතුමා ඉදිරිපත් කරලා තිබුණා.ඒක ලබා දෙන්න කියලා. ඒ එකඟතාවය ලබා දෙන්න බෑ. ඒ සම්බන්ධයෙන් අපේ විරුද්ධත්වය මේ සභාවේ අපි ප්‍රකාශ කළා.ඒක එතුමට දන්වන්න.පියල් ඇමතිතුමාටත්,මජරින් ඇමතිතුමාටත් ඒ ලිපියේ පිටපත් යවන්න.
ඒ වගේම බේරුවල මරදාන වැරිටි එක අපෙන් හොඳ යෝජනාවක් කරලා තිබුණා.දැනට ලක්ෂ 25 ක් පමණ වියදම් කරලා ආදායම් උපදවන්න සකස් කරලා තියෙනවා.ඉතිරි කොටස ආදායම් උපදවන්න පුළුවන් තත්ත්වයකටත් ගමේ වැඩ පොදු විනෝදාත්මක කටයුතු වලට එම ගොඩනැගිල්ල පාවිච්චි කිරීම සඳහා අවසරල ඉල්ලා තියෙනවා.අපි පළාතේ ගරු පාලරීමේන්තු මන්ත්‍රීතුමත් එක්කත් කතා කරලා අපි තීරණයක් ගමු.

බේරුවල නගරය තුළ චීන ජාතිකයෝ ඇවිල්ලා මැණික් ව්‍යාපාරයට සම්බන්ධවෙලා මැණික් මිළදී ගන්නවා.තවත් විදෙස් ජාතිකයෝ එනවා. ඒ එන අය එක වතාවකදී කෝටි 10 ක විතර මැණික් අරගෙන යනවා.ඒ අයට බැරි කමක් නෑ රුපියල් වාෂරීකව 10000.00 පමණ අපේ නගර සභාවට ගෙවන්න.ඒ ගේන අය සමඟ අපි සාකච්ඡා කරා .ඒ අයත් කැමතියි.ඒකට අපි තීරණයක් ගන්න ඕන.ඒ වගේම ධිවර යාත්‍රා වලින් අපිට විශේෂ ගානක් අය කරන්න පුළුවන්.ඒ වගේම මැණික් වෙළඳාම් කරන අයගෙනුත් අය කරන්න පුළුවන්.අපිට අඩුම ගානේ කෝටි 10 ක වත් ආදායමක් ලබාගන්න පුළුවන්.අරුස් මන්ත්‍රීතුමා කියනවා වගේ අපි නිධානයක් උඩ තමයි වාඩි වෙලා ඉන්නේ.එතකොට අපිට මේ ආදායම් ටික රැස් කර ගත්තානම් මීට වඩා සංවධර්න කටයුතු කරන්න පුළුවන්.ජනතාවගේ වරිපනම් ආදායමට අමතරව . අද රැස්වීම ඉතා සාථර්කව කරගෙන යන්න සියළු දෙනාමෙ සහයෝගය දැක්වුවා.සභාවේ කටයුතු මෙයින් අවසන් කරනවා.ස්තුතිය.

**ප:ව: 1.44** ට සභාවේ කටයුතු අවසන් විණ.

***මෙම සභා වාතර්ාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා අතර යම් අනනුකූලතාවයක් ඇති වූවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේ ය.***

| | |
|---|---|
| ................................ | ............................................ |
| **අශෝක රණසිංහ,** | **අල්හාජ් ඇම්.මසාහිම් මොහොමඩ්,** |
| **ලේකම්,** | **සභාපති,** |
| **බේරුවල නගර සභාව.** | **බේරුවල නගර සභාව.** |